# උපන් බිම් සහ නැවත පැමිණීමේ කතාන්දර



*පලවා හැරීමෙන් වසර 30ක් ගතව ඇති උතුරේ මුස්ලිම්වරුන්*

LAW & SOCIETY TRUST

PARL
People's Alliance for Right to Land

# උපන් බිම් සහ නැවත පැමිණීමේ කතාන්දර
# පලවා හැරීමෙන් වසර 30ක් ගතව ඇති උතුරේ මුස්ලිම්වරුන්

අමලිනි ද සේරා සහ නටාෂා වැන්-හොෆ්

LAW & SOCIETY TRUST

PARL
People's Alliance for Right to Land

© 2020 නීතිය හා සමාජභාරය සහ ඉඩම් අයිතිය සඳහා වන ජනතා සන්ධානය

LAW & SOCIETY TRUST

People's Alliance for Right to Land

නීතිය හා සමාජභාරය
අංක 03, කින්සි ටෙරස්,
කොළඹ 08,
ශ්‍රී ලංකාව
දුරකතන + 94 (0) 112684845
ෆැක්ස් + 94 (0) 112686843
admin@lstlanka.org
www.lstlanka.org

ඉඩම් අයිතිය සඳහා වන ජනතා සන්ධානය
parlnetworksl@gmail.com
www.parlsl.com

## පටුන

1990 ඔක්තෝබර් - අවුරුදු 30 කට පසු……01

හැඳින්වීම.....…………………...………………05

මේවන විට ඔවුන් සිටින්නේ කොහේද?...............06

යාපනය ……………………………..…...…07

මුලතිව්………………………………………13

පුත්තලම……….………………………..…19

මීගමුව…………….………..…………………...13

# 1990 ඔක්තෝබර් - අවුරුදු 30 කට පසු

1990 ඔක්තෝබර් මාසයේ දී දෙමළ ඊලාම් විමුක්ති කොටි සංවිධානය විසින් උතුරු පළාතේ මුස්ලිම්වරුන් 75,000 ක් (පළාතේ මුළු ප්‍රමාණයෙන් සියයට පහක් පමණ) පමණ දෙනෙක් තම උපන් බිමෙන් බලහත්කාරයෙන් එළවා දමන ලදි. පළාතෙන් පිටවීමට මුස්ලිම්වරුන්ට ඇතැම් ස්ථානවලදී කැරලිකරුවන් විසින් ලබා දී තිබුණේ පැය 48 ක් පමණි. ඔක්තෝබර් 15 දිනයේ චවාකච්චේරියේ සිට ආරම්භ කොට ඔක්තෝබර් 30 දිනය වන විට මන්නාරම, මුලතිව්, කිලිනොච්චිය, යාපනය සහ වවුනියාවේ ඇතැම් ප්‍රදේශවලින් මුස්ලිම්වරුන් ඉවත් කරනු ලැබීය. ඇතැම් පවුල්වලට ගෙන යාමට අවසර දී ඇත්තේ රුපියල් 500 ක් සහ ඇඳුම් කිහිපයක් පමණි; සමහරුන්ට කිසිවක් නොමැතිවම පලා යාමට බල කර තිබුණි. දකුණේ නගර කරා ළඟා වන තුරු ප්‍රවාහන පහසුකම් ලබා ගැනීමට නොහැකි වූ බොහෝ දෙනෙක් දින තුනක් පමණ පා ගමනින් ගොස් තිබුණි.

මාගේ පවුලත් ඔවුන් අතර විය - ඒ වන විට කොළඹ ශිෂ්‍යාවක වශයෙන් සිටි මා, මාගේ පවුලේ සාමාජිකයින් මන්නාරමේ පිහිටි අපේ නිවසින් පලා යෑම පිළිබඳ වූ ප්‍රවෘත්ති දෙස සාංකා සහගතව බලා සිටියෙමි.

අදවන විටත් මෙම ප්‍රජාවේ දුක් වේදනා සඳහා නිල වශයෙන් හඳුනාගැනීමක් ලැබී නැත. එසේම ඔවුන්ගේ ආපසු පැමිණීම වෙනුවෙන් හෝ වන්දි ලබාදීම වෙනුවෙන් ප්‍රමාණවත් සහයක් ලැබී නැත. දශක තුනක් පුරා ප්‍රදේශවාසීන්, රජයේ නිලධාරීන්, ජාත්‍යන්තර පරිත්‍යාගශීලීන් සහ දකුණේ මුස්ලිම්වරුන් විසින් තමන්ව නොසලකා හැරීමත් වරදවා වටහා ගැනීමත් නිසා උතුරේ මුස්ලිම්වරුන්ට විශ්වාස කළහැකි කිසිවෙකුත් නොමැති බව හැඟී ගොස් තිබේ.

2009 මැයි මාසයේ සිවිල් යුද්ධය අවසන් වූ දා සිට, උතුරේ මුස්ලිම්වරුන් සැලකිය යුතු සංඛ්‍යාවක් ආපසු පැමිණීම ආරම්භ කොට තිබේ. එහෙත් ඔවුන්ගේ නැවත පැමිණීම සැමවිටම හොඳ පිළිගැනීමට ලක් වී නැත. රජයේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් විසින්, මුස්ලිම් නැවත පැමිණෙන්නන්ගේ සංඛ්‍යාව අඩුවෙන් සඳහන් කර තිබෙන බවත්, ඒ නිසා ඔවුන් සඳහා සම්පත් වෙන් කිරීම සහ නැවත පදිංචි කරවීම සඳහා අවශ්‍ය සංවර්ධන සහයෝගය ලබාදීම සැලකිය යුතු ලෙස අඩුවන බවත් කියැවේ. උතුරේ රජයේ නිලධාරීන් ඒ සඳහා ප්‍රතිචාර ලෙස දක්වන්නේ මුස්ලිම්වරුන් දැනටමත් පුත්තලමේ 'හොඳින් පදිංචි වී සිටින' බැවින් රජයේ ප්‍රමුඛතාවය විය යුත්තේ යුද්ධයෙන් පීඩාවට පත්වූවන් වෙත බවයි. යුද්ධයෙන් පීඩාවට පත් දෙමළ සිවිල් වැසියන්ගේ තත්වය තවමත් ඉතාම දුක්ඛිත බව සත්‍යයකි. යුද්ධය අවසන් වී දශකයකට පසුවත් ඉඩම්, නිවාස හා වෙනත් මූලික අවශ්‍යතා නොමැතිව තවමත් බොහෝ දෙනෙකු සිටින අතරම ඔවුන් බියජනක අවකාශයක් තුළ සත්‍යය සහ යුක්තිය උදෙසා තවදුරටත් අරගල කරමින් සිටී. මෙම අවශ්‍යතා ඉතාමත්ම වැදගත්වන නමුත් ඒවාට විසඳුම් සෙවීමේ දී සාමූහිකව නැවත පැමිණීමට උතුරේ මුස්ලිම්වරුන්ට තිබෙන අයිතියට අවහිර නොකළ යුතුය.

### පිට පිට අත්වැරදීම්

එල්ටීටීඊයට ඔවුන්ගේ ජනවාර්ගික පිරිසිදු කිරීමේ ක්‍රියාව සම්බන්ධයෙන් දැඩි විවේචන එල්ල වුවද, 2002-2005 සාම සාකච්ඡා අතරතුර දී එල්ටීටීඊ නායක වේලුපිල්ලේ ප්‍රභාකරන් මේ සම්බන්ධයෙන් පැහැදිලිවම නිහඬව සිටියේය.

තවද, නෝර්වේජියානු මැදිහත්කරුවන් ද ඇතුළුව සාකච්ඡාවල නිරත වූ කිසිදු පාර්ශ්වයක් විසින් උතුරේ සාමාන්‍ය තත්වය ස්ථාපිත කිරීමේ මූලික කොන්දේසියක් වශයෙන් උතුරේ මුස්ලිම්වරුන්ගේ ආපසු පැමිණීමේ අයිතිය පිළිබඳව සලකා බැලුවේ නැත. 2002 සටන් විරාමය තුළ ආපසු පැමිණි දෙමළ අභ්‍යන්තර අවතැන්වූවන් හා සසඳන විට නෙරපා හරින ලද මුස්ලිම්වරුන් පැමිණීම පහළ අනුපාතයක් තිබීමට ප්‍රධානම හේතුව මෙයයි.

සිය පළමු ධුර කාලය ආරම්භයේ දී, 2005 අග භාගයේ දී, ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතා, උතුරේ මුස්ලිම්වරුන් නෙරපා හැරීම පිළිබඳව සොයා බැලීමට ජනාධිපති කොමිසමක් පත්කරන බවට පොරොන්දු විය - මෙය ඔහු කිසිදිනක ඉටු නොකළ පොරොන්දුවකි. යුද්ධයේ අවසානය සැමරීමේ උත්සවයක දී හිටපු ජනාධිපතිවරයා මෙසේ පැවසීය: “එල්ටීටීඊය විසින් අහිංසක මුස්ලිම්වරුන්ට හිරිහැර කොට බලහත්කාරයෙන් නෙරපා හරින විට කිසිවෙකුත් මෙම අවතැන්වීම නැවැත්වීමට ඉදිරිපත් වුණේ නැහැ. දැන් මගේ රජයෙන් ත්‍රස්තවාදය අවසන් කිරීමත් සමඟ 2010 මැයි මාසය වන විට මුස්ලිම්වරුන් නැවත පදිංචි කරවීමට සියලුම උත්සාහයන් ගන්නවා.” ඉවත් කරන ලද මුස්ලිම්වරුන් පිළිබඳව රජයේ ජ්‍යෙෂ්ඨයෙකු විසින් නිශ්චිත ප්‍රකාශයක් සිදුකළ පළමු අවස්ථාව මෙම කතාව මගින් සනිටුහන් වී තිබේ. එසේ වුවද, ඔහුගේ කඩිනම්, පශ්චාත්-යුද කාලීන ජාතිය ගොඩනැගීමේ ක්‍රියාවලිය තුළ උතුරේ මුස්ලිම්වරුන්ට නැවත පැමිණීමේ අයිතිය ලබාදීම සඳහා ප්‍රමුඛත්වය ලබාදීමට රාජපක්ෂ අසමත් විය. දශකයකට පසු, පාස්කු ඉරිදා ප්‍රහාරයන් මගින් මුස්ලිම් විරෝධී හැඟීම් අවුස්සමින් නැවතත් බලයට පැමිණීමට රාජපක්ෂවරුන් පෙළඹීමත් සමඟ තම දුක්ඛිත තත්වය සඳහා සහයෝගය සහ පිළිගැනීම ලබා ගැනීමේ අපේක්ෂාවෙන් නැවතත් රජය සමඟ සම්බන්ධ වීමේ තේරුමක් තිබේදැයි මුස්ලිම්වරුන් ප්‍රශ්න කරමින් සිටියි.

එල්ටීටීඊය විවේචනය කරන විට හෝ දෙමළ ඊලාම් පිළිබඳව ප්‍රකාශ කරන විට දී බොහෝ විට රජයේ නිලධාරීන් සහ සිංහල ජාතිකවාදී විචාරකයින් උතුරේ මුස්ලිම්වරුන්ගේ දුක්ඛිත තත්වය ඉදිරියට ගෙන ඒම සිදුවේ. නමුත් පලා යාමට බලකෙරුණු අයට කුමක් සිදුවූයේ ද, සහ ඔවුන් වෙනුවෙන් කුමක් කළ යුතු ද යන්න අව්‍යාජව සලකා බලන්නේ ඉතාමත්ම ස්වල්ප දෙනෙකු පමණි. උතුරේ මුස්ලිම්වරුන් මෑත කාලයේ දී පුළුල් මුස්ලිම් ප්‍රජාව හා සමානවම වෛරයට මුහුණ දී සිටිති.

2015 සිට 2019 දක්වා වූ කාලය තුළ යෝජිත සංක්‍රාන්ති යුක්ති යාන්ත්‍රණයන් මගින්, උතුරේ මුස්ලිම්වරුන්ගේ දුක්ගැනවිලි විසඳීමට ගත් මුල් උත්සාහයන් අත්හැර දමා තිබේ. මානව හිමිකම් කොමසාරිස් කාර්යාලය විසින් දියත් කරන ලද ශ්‍රී ලංකාව පිළිබඳ OHCHR විමර්ශන වාර්තාව (OISL) තුළින් විමර්ශනයට ලක් කරනු ලැබුවේ 2002 පෙබරවාරි සටන් විරාමයේ සිට 2011 දක්වා කාලය පමණි. එනම්, එල්ටීටීඊය විසින් උතුරේ මුස්ලිම්වරුන් ජනවාර්ගික වශයෙන් අතුගාදැමීම වැනි ඊට පෙර සිදු වූ අපරාධ මෙහි දී නොසලකා තිබේ. 2015 දී එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලයේ අංක 30/1 යෝජනාව අනුව සංක්‍රාන්ති යුක්තිය උදෙසා ශ්‍රී ලංකා රජය කැප වූ අවස්ථාවේ දී, ඊට පෙර සිදුවීම් සඳහා ඒ ආකාරයෙන් පිළිතුරු සෙවීමට කැප වූයේ නැත. කෙසේ වෙතත්, ප්‍රතිසන්ධාන යාන්ත්‍රණයන් සඳහා වූ විශේෂ කාර්ය සාධක බලකාය විසින් මෙහෙයවනු ලබන මහජන නඩු විභාගයේ දී ක්‍රියාකාරී භූමිකාවක නියැළීමට උතුරේ මුස්ලිම්වරුන් උත්සාහ කළ නමුත් එහි කිසිදු ප්‍රතිඵලයක් ඇති වී නැත. ඒ හේතුවෙන් වර්තමාන වන්දි ගෙවීමේ ප්‍රතිපත්තිය තුළ කිසිදු ආකාරයකින් උතුරේ මුස්ලිම්වරුන්ට සිදුවී ඇති හානිය නිශ්චිතව හඳුනා ගැනීමක් සිදු නොවේ.

දැනටමත් වසර 30 කට ආසන්න කාලයක් නොසලකාහැරීමේ ප්‍රතිඵලවලින් පීඩා විඳින උතුරේ මුස්ලිම්වරුන්ට, මෑතක දී ඔවුන්ගේ මූලික ප්‍රජාතන්ත්‍රවාදී අයිතිවාසිකම් අහිමි කිරීම්වලටද මුහුණ දීමට සිදුවී තිබේ. 2019 නොවැම්බර් මාසයේ පැවති ජනාධිපතිවරණය සඳහා පුත්තලමේ සිට මන්නාරමට ඡන්දය ප්‍රකාශ කිරීමට ගිය උතුරේ මුස්ලිම්වරුන්ට ප්‍රහාර එල්ල විය. 2019 නොවැම්බර් 16 වන දින උදෑසන මන්නාරමට යන අතරමග තන්තිරිමලේ දී ඔවුන්ගේ බස් රථවලට වෙඩි තබා තිබුණි. ඡන්දය දීමෙන් පසු එදින සවස මැදවච්චියේ දී සිංහල මැර කණ්ඩායම් විසින් ද ඔවුන්ට නැවතත් පහර දෙන ලදි. බොහෝ කාන්තාවන් හා ළමුන් තුවාල ලබා ඇති නමුත් මේ දක්වා කිසිදු පරීක්ෂණයක් පවත්වා නැත. ඒ පිළිබඳව මැතිවරණ කොමිසමේ විමර්ශන වාර්තාවක් පවා නැත. මැදවච්චියේ ප්‍රහාරයට පෙර ඔවුන්ගේ බස් රථ පොලිසිය විසින් වෙට්ටිකුලම්හි දී නතරකොට පැය ගණනක් ඔවුන්ව රඳවා ගෙන තිබේ. තුවාල ලැබූ ඡන්දදායකයින් බොහෝ දෙනෙකු පළිගැනීම්වලට ලක්වේ යැයි බියෙන් වෛද්‍ය ප්‍රතිකාර ලබා ගෙන නැත.

මෙම ප්‍රචණ්ඩත්වය නිසා, 2020 අගෝස්තු මාසයේ පැවති පාර්ලිමේන්තු මැතිවරණය සඳහා මෙම ඡන්දදායකයින් 6000 කට අධික සංඛ්‍යාවක් වෙනුවෙන් පුත්තලමේ පොකුරු ඡන්ද මධ්‍යස්ථාන පිහිටුවීමට මැතිවරණ කොමිසම එකඟ වී තිබේ. මෙම ධනාත්මක වර්ධනය තිබියදීත්, මන්නාරමේ සහකාර මැතිවරණ කොමසාරිස්වරයා විසින් මන්නාරමේ ස්ථිරව ජීවත්වන ඡන්ද දායකයින් පමණක් ලියාපදිංචි කරන ලෙස දිස්ත්‍රික්කයේ ග්‍රාම නිලධාරීන්ට උපදෙස් දී තිබුණි. සිවිල් සමාජ ක්‍රියාකාරීන් විසින් ප්‍රශ්න කළ විට ‘‘පාවෙන ඡන්දදායකයින්’’ සිටිය නොහැකි බව ඔහු පවසා තිබුණි: පුත්තලමේ වෙසෙන ජනතාව පුත්තලමේ ලියාපදිංචි වී ඡන්දය ලබා දිය යුතුය.

බොහෝ වාරයක් වන්නිය තුළම අවතැන්වීම් අත්විඳි යුද්ධයෙන් අවතැන් වූ දෙමළ ජනයා මෙන් නොව, බලහත්කාරයෙන් ඉවත් කරන ලද මුස්ලිම්වරුන්ට යුද්ධයෙන් විනාශ වූ තම නිවෙස්වලින් ඈත්ව ජීවත් වීමට බල කෙරී තිබුණි. ඒ අනුව, වන්නියේ දෙමළ ජනයාට මුහුණදීමට සිදුවූ සමූල ඝාතන හා දරුණු විනාශයන්වලින් ඔවුන් ගැලවී තිබෙන බව සත්‍යයකි. නමුත් උතුරේ මුස්ලිම්වරුන්ට ලැබිය යුතු ආපසු පැමිණීමේ සහ නැවත පදිංචිවීමේ අයිතිවාසිකම් ලැබිය හැකිවිට සහ ඉල්ලා සිටිනවිට ඔවුන්ව ඒ සඳහා නුසුදුස්සන් කරවීමට එම තත්වය භාවිතා නොකළ යුතුය. උතුරේ ප්‍රජාවන් අතර තවදුරටත් සැකය හා අවිශ්වාසය වර්ධනයවීම වළක්වා ගැනීම වෙනුවෙන්, උතුරේ ක්‍රියාත්මකවන වෙනත් නැවත පදිංචි කිරීම් හා සංවර්ධන වැඩසටහන් සමඟ සමාන්තරව ආපසු පැමිණීමට උතුරේ මුස්ලිම්වරුන්ට ඇති අයිතියේ යුක්තිසහගත භාවය හඳුනා ගැනීම ද අත්‍යවශ්‍ය වේ. දැනටමත්, උතුරට ආපසු පැමිණි ඇතැම් මුස්ලිම්වරුන්ට තම ගම්වල සීමාවන් වෙනස් වී ඇති බවත්, එහි ප්‍රතිඵලයක් ලෙස ඉඩම් සඳහා තමන්ගේ ප්‍රජා අයිතිවාසිකම් අහිමි වී ඇති බවත් දැන ගැනීමට ලැබී තිබේ.

රජයේ නිලධාරීන් විසින් ගම්වල මායිම් වෙනස් කිරීමේ දී, මහජන ඉඩම් - රජයේ පාසල්, සුසාන භූමි, පූජනීය ස්ථාන, ක්‍රීඩා පිටි හෝ සතුන් සඳහා තණබිම් වශයෙන් පවා වෙන් කොට තිබූ ඉඩම්- අත්පත් කරගෙන ඒවා නව ජනාවාස සඳහා නැවතත් බෙදා හැරීම සිදුවී තිබේ. දශක ගණනාවක් තම භූමියෙන් ඈත්ව ජීවත්වීමට සිදු වූ අවතැන් වූ මුස්ලිම්වරුන්ට මෙම තීරණ ගෙන ඇති ආකාරය පිළිබඳව තමන්ගේ කිසිදු අදහසකට ඉඩක් නොතබාම එහි ප්‍රතිඵලයක් වශයෙන් අතිරේකව අමතර පාඩු විඳීමට ද සිදුවී තිබේ.

**කල හැක්කේ කුමක්ද?**

දෙමළ දේශපාලනඥයින් අතලොස්සක් සහ ප්‍රජාවේ හා ඩයස්පෝරාවේ සාමාජිකයින් අතළොස්සක් දෙනා මෙම ප්‍රශ්නය පිළිබඳව සැළකිල්ලක් දක්වා තිබුණත්, සමස්තයක් වශයෙන් දෙමළ දේශපාලනය 1990 මුස්ලිම්වරුන් නෙරපා හැරීම පිළිබඳව නිහඬව හිඳ තිබේ. 2009 සැප්තැම්බරයේ දී එවකට ජනාධිපති රාජපක්ෂ මහතා සමඟ සුළුතර අවශ්‍යතා පිළිබඳව පැවැත් වූ රැස්වීමක දී දෙමළ ජාතික සන්ධානය (TNA) විසින් පළමු වරට උතුරේ මුස්ලිම්වරුන්ගේ ගැටලුව පිළිබඳ කාරණය ප්‍රසිද්ධියේ ඉස්මතු කරන ලදි. 2013 දී උතුරු පළාත් සභා මැතිවරණයෙන් TNA ජයග්‍රහණය කළ පසු උතුරේ මුස්ලිම් ජනතාව කෙරෙහි වූ සිය ධනාත්මක ප්‍රවේශය විදහා දැක්වීම වෙනුවෙන් මුස්ලිම් අයෙකු මන්ත්‍රීවරයෙකු වශයෙන් ඔවුන්ගේ ප්‍රසාද ආසනයකට පත් කරන ලදි. TNA මන්ත්‍රීවරුන් සුළු පිරිසක් විසින් මෙම ගැටලු ඍජුවම විසඳීමට ගත් උත්සාහයන් ඉමහත් පිළිගැනීමකට ලක් වූ අතර, එය රටේ විශාලතම සුළුතර ජනවර්ගයන් දෙකේ අයිතිවාසිකම් සුරක්ෂිත කිරීමේ උත්සාහයක් ලෙස ද සැලකුණි. අගෝස්තු මාසයේ පැවති පාර්ලිමේන්තු මැතිවරණයේ දී, කිලිනොච්චියේ සහ යාපනයේ මුස්ලිම්වරුන් දෙමළ ජාතික සන්ධානයේ නියෝජිතයන් කිහිප දෙනෙකු සඳහා විවෘතවම සහයෝගය ලබාදුන් අතර ඔවුන් දෙමළ ජාතික සන්ධානයට තම ඡන්දය ද ලබා දෙන ලදි. මෙම ප්‍රශංසනීය දේශපාලන පියවර තිබියදීත්, නෙරපා හරින ලද උතුරේ මුස්ලිම්වරුන් වෙනුවෙන් බොහෝ දෙමළ නායකයින් සහ බුද්ධිමතුන් තවමත් තම සහයෝගිතාවය පෙන්වා නැත.

තම ජීවිත මුල සිටම නැවතත් ආරම්භ කිරීමේ බලාපොරොත්තුවෙන් හා තම දෙමළ සහෝදර සහෝදරියන් සමඟ නැවතත් සහජීවනයෙන් ජීවත්වීමේ උවමනාවෙන් කිසිවෙකුගෙන් කිසිවක් බලාපොරොත්තු නොවී මුස්ලිම්වරුන් උතුරට නැවත පැමිණෙමින් සිටිති. සමාන සැලකිල්ලක් දැක්වීම, තම ඉඩම් සඳහා ප්‍රවේශය ලබාදීම, මූලික ජීවනෝපාය ක්‍රියාකාරකම් ලබාදීම සහ වනාන්තර බවට පත්වී ඇති ඔවුන්ගේ ඉඩම් කඩිනමින් නිෂ්කාශනය කිරීම වැනි ඉල්ලීම් හැරුණු විට ඔවුන් විසින් ඉල්ලීම් කිහිපයක් ඉදිරිපත් කර තිබේ. තම පවුල් වෙනත් තැනක ජීවත් වීමට තෝරා ගත්තේය යන්න නොසලකා නෙරපා හරින ලද මුස්ලිම්වරුන්ට තම භූමියේ තම දේපළ හා ජීවනෝපාය අවස්ථා නැවත ලබා ගැනීමට අයිතියක් තිබෙන බව දෙමළ රජයේ නිලධාරීන් සහ උතුරේ දේශපාලනඥයින් විසින් පිළිගැනීම අත්‍යාවශ්‍ය වේ.

විශ්වාසය ගොඩනැගෙන විට, තවත් උතුරේ මුස්ලිම්වරුන්ට තම මුතුන් මිත්තන්ගේ ඉඩම් සහ සංස්කෘතික උරුමයන් වෙත නැවතත් පැමිණ ඒවා නැවත ලබා ගැනීමට ආරක්ෂිත බවක් දැණෙනු ඇත. කෙසේ වෙතත්, මේ මොහොතේ, ඔවුන්ගේ නැවත පැමිණීමට එරෙහිව සාමූහික ප්‍රතිරෝධයක් පවතින බව පෙනේ. මෙහි දී උතුරේ මුස්ලිම්වරුන් සහ ද්‍රවිඩ ජාතිකයන් අතර තවදුරටත් වාර්ගික ගැටුම් ඇතිවීමට ඉඩ ඇති අතර බහුතරවාදයට ප්‍රතිලාභ සැලසෙන පරිදි දෙමළ ජනතාවගේ දිගුකාලීන අපේක්ෂාවන්ට හා ඔවුන්ගේ තවමත් නොවිසඳුණු දේශපාලන අභිලාෂයන්ට හානි පැමිණෙනු ඇත. ජාත්‍යන්තර ප්‍රජාවේ සහ සානුකම්පිත සිංහලයන්ගේ සහය ඇතිව ගැඹුරු සහයෝගීතාවය වෙනුවෙන් ප්‍රමුඛතාවය දීම සහ තම වෙනස් නමුත් ගැඹුරින් බැඳී ඇති දුක්ගැනවිලි හා වේදනා තුළින් කටයුතු කිරීම ප්‍රජාවන් දෙකේම යහපත සඳහා වනු ඇත.

ශ්‍රීන් සරූර්

# හැඳින්වීම

මෙම කෘතිය 1990 දී එල්ටීටීඊය විසින් උතුරු පළාතෙන් ඉවත් කරන ලද මුස්ලිම් ප්‍රජාවේ කාන්තාවන්ගේ වර්තමාන ජීවමාන යථාර්ථයන් ග්‍රහණය කර ගැනීමට උත්සාහ කරන ආඛ්‍යාන එකතුවකි.


උතුරේ මුස්ලිම්වරුන්ගේ කථාව දේශපාලන හා සමාජීය අවකාශයන් තුළ අමතක වී ඇති ආකාරයත්, මාධ්‍ය හෝ සිවිල් සමාජ සංවිධාන කිහිපයක් පමණක් ඔවුන්ගේ දුක්ඛිත තත්වය සමඟ සම්බන්ධ වී ඇති බවත් ප්‍රජා සාමාජිකයින් කිහිප දෙනෙකු සඳහන් කරයි. නෙරපා හැරීමෙන් වසර තිහකට පසුව මෙම ප්‍රජාව විසින් අත්විඳින ලද සහ අඛණ්ඩව අත්විඳිමින් සිටින අරගලයන් වාර්තාගත කිරීම වෙනුවෙන් මූලික වශයෙන් මෙම කාර්ය සිදු කරන ලදි.

මෙහි දී ඉදිරිපත් කර ඇති අදහස්, 2020 මුල් භාගයේ පුත්තලම, මන්නාරම, යාපනය සහ මීගමුව යන නගරවල ප්‍රජාවන් සමඟ, මූලික වශයෙන් කාන්තා කණ්ඩායම් සමඟ පවත්වන ලද සංවාද ගණනාවක් මගින් ලබාගත් ඒවාය. මෙම සංවාද මගින් ඔවුන්ගේ තෝරාගැනීම්වල සංකීර්ණතාවයන් සහ නැවත පැමිණීමේ ක්‍රියාවලිය ග්‍රහණය කරගෙන ඇති අතර ඒවා රේඛීය හෝ සරල නොවේ. ආපසු පැමිණි අය තමන් මුහුණ දී ඇති දේශපාලන හා පරිපාලන බාධක සහ අවට දෙමළ ප්‍රජාව සමඟ පවතින ඔවුන්ගේ සබඳතාවයන් විස්තර කරයි. ඔවුන් අවතැන් වී සිටින තැන තවමත් ජීවත්වන්නන්, අවට ප්‍රජාවන් සමඟ තමන්ට ඇති අභියෝග ගැන කතා කළ අතර,  තම 'නිවස'එක් තැනක නොව විවිධ තැන්වල තිබීම පිළිබඳව ද කතා කරන ලදි. පෞද්ගලිකත්වය සහ ආරක්ෂාව සහතික කිරීම සඳහා නම් භාවිතා නොකිරීමට කතුවරුන් තීරණයක් ගෙන ඇත. .

මෙම සංවාදවල දී තම අදහස්, මතකයන් සහ සිතිවිලි බෙදාහදා ගැනීමට කාලය ගත කළ සැම දෙනාටම කතුවරුන් බෙහෙවින් කෘතඥ වේ. සම්බන්ධතා ඇති කිරීමට සහ සංවාද සඳහා පහසුකම් සැලසීමට දැක්වූ සහයෝගය වෙනුවෙන් Women's Action Network (කාන්තා ක්‍රියාකාරී ජාලයට) සහ Muslim Women's Development Trust (මුස්ලිම් කාන්තා සංවර්ධන භාරයට) ද ඔවුන් ස්තුතිවන්ත වේ. 1990 ඔක්තෝම්බර් මාසයේ දී එල්ටීටීඊය විසින් උතුරු පළාතෙන් මුස්ලිම්වරුන් නෙරපා හැරීම පිළිබඳ පුරවැසි කොමිෂන් සභාවට ද ඔවුන් ස්තුතිවන්ත වේ. එම කොමිසමේ 2001 වාර්තාව 'නිදහස සොයායෑම: උතුරේ මුස්ලිම්වරුන්ගේ කතාව' මගින් මෙම ප්‍රජාවේ අවතැන්වීම, සංක්‍රමණ රටාවන් සහ වෙනත් කරුණු පිළිබඳ සවිස්තරාත්මක හා පරිපූර්ණ විස්තරයක් ඉදිරිපත් වේ.

# මේවන විට ඔවුන් සිටින්නේ කොහේද?

මෙම ව්‍යාපෘතිය සඳහා කතුවරුන් සමඟ කතා කළ කාන්තාවන්ගේ පවුල්, ආදරණීයයන් සහ මිතුරන් 1990 දී උතුරෙන් අවතැන්වීමෙන් පසුව දැන් වාසය කරන ස්ථාන මෙම ලක්ෂ මගින් පෙන්නුම් කරයි. අවතැන් වූ සහ ආපසු පැමිණි උතුරේ සමස්ත මුස්ලිම් ජනගහනය එයින් නියෝජනය නොවේ.




පුත්තලම, පානදුර, පලන්ගතුරෙයි, පෝරුතොට, පෙරියමුල්ල, මදුරන්කුලිය, වනාතවිල්ලුව, පුලිච්චකුලම්, සාරිකාමුල්ල, තොටවත්ත, කුරුණෑගල, කැකුණුගොල්ල, අකුරණ, බේරුවල, කටුගස්තොට, නච්චිකුඩා, අටුලුගම, ආනමඩුව, මීගමුව, කල්පිටිය, අලන්කුඩා, කයිට්ස්, යාපනය, මුලතිව්



## යාපනය

1990 ඔක්තෝම්බර් මාසයේ නෙරපා හැරීම නිසා මුස්ලිම් පවුල් 3,500 කට යාපනයෙන් පලා යාමට සිදුවිය. වසර 30 කට පසු ආපසු පැමිණ ඇත්තේ 750 ක් පමණි.

තමන් අවතැන් වූ ප්‍රදේශවල සුරක්ෂිත රැකියා සහ ව්‍යාපාර සොයාගත් සහ දැන් එම ප්‍රදේශවල පාසල්වලට තම දරුවන් ඇතුළත් කරඇති බොහෝ දෙනෙකු ආපසු පැමිණ නැත. නැවත පදිංචිය වෙනස් කිරීමේ වෙහෙස දරාගත නොහැකි බොහෝ වැඩිහිටියන් ද ආපසු පැමිණ නැත. ආපසු පැමිණි අය අතර බොහොමයක් දෙනා 1990 දී ඉවත්ව යන විට ළමයින් ව සිටි අයයි.

***"අපේ බොහෝ වැඩිහිටියන් ආපසු පැමිණියේ යාපනයේ අපේ ඉඩම අපට අයිති බවට ඇති දැඩි විශ්වාසය නිසා. ඒ අපට අයිතියි කියලා කියන්න පුළුවන් තැනක්."***

**නිවාස නැවත ගොඩනැඟීම, ඉඩම් නැවත ලබා ගැනීම**

යුද්ධය අවසන් වූ වහාම පවුල් කිහිපයක් 2010 දී උතුරු අර්ධද්වීපයට පැමිණ තිබුණි. ඉන්දියානු රජයේ ආධාර මගින් සිදුකරන නිවාස ව්‍යාපෘතියක් හරහා ඔවුන්ට නිවාස ලබා ගැනීමට වසර ගණනාවක් බලා සිටීමට සිදුවී තිබේ. මෙම ව්‍යාපෘතිය යටතේ නිවාස ලබා ගැනීම සඳහා පුද්ගලයින් 313 දෙනෙකු විසින් අයදුම්පත් ඉදිරිපත් කළ අතර මේ දක්වා නිවාස ලැබී ඇත්තේ 190 දෙනෙකු සඳහා පමණි.

***"ආපසු පැමිණි පවුල් 750 කින් තමන්ගේම ඉඩම් තිබෙන්නේ ඉතාම සුළු කොටසකට විතරයි. අනෙක් අය කුලී ගෙවල්වල හෝ ඥාතීන් සමඟ ජීවත් වෙනවා. ඇතැම් අය නැවත පැමිණීමේ සූදානමක් නොතිබූ තම ඥාතීන්ගේ හිස් නිවාසවලට පදිංචියට ගොස් තිබෙනවා. ඇතැම් පුද්ගලයින් අලුත් ඉඩම් ගැනීම සඳහා තම නිවාස විකුණා තිබෙනවා. කුළිය තාමත් ඉතාම වැඩියි. ඒ වගේම එහෙම ගන්න පුළුවන් තත්වයේ ගෙවල් වැඩිය නැහැ."***

සටන්වලින් හානියට පත් හා පසුව දශක තුනකට අධික කාලයක් තිස්සේ භාවිතයට ගෙන නොතිබූ නිවාස ඒවායේ අයිතිකරුවන්ටම තම පුද්ගලික මුදලින් සකස්කර ගැනීමට සිදු වී තිබේ. රජයෙන් සහ සහ විවිධ ජාත්‍යන්තර නිවාස ව්‍යාපෘති විසින් සපයන ලද නිවාස සියල්ලම අලුත් ඒවා ය.



ඔවුන් ආපසු පැමිණි විට, එක්සත් ජාතීන්ගේ සරණාගතයින් සඳහා වූ කොමසාරිස් කාර්යාලය විසින් සෑම පවුලකටම ඔවුන්ගේ නිවස නැවත ගොඩනැඟීම සඳහා උපකරණ සහ ද්‍රව්‍ය මෙන්ම මුළුතැන්ගෙයි උපකරණ හා ද්‍රව්‍ය ද ඇතුළත් පැකේජයක් ලබා දෙන ලදි. යුද්ධයෙන් පසු සම්ප්‍රදායික නිජබිම් වෙත ආපසු යන අවතැන් වූවන්ට රජයෙන් තවත් වන්දි පැකේජයක් ලබා දෙන ලදි. මේ අනුව, පවුල්වලට මුලින්ම රුපියල් 5,000 ක ගෙවීමක් ලැබී ඇති අතර, පසුව තවත් රුපියල් 25,000 ගෙවීමක් ලැබීමට නියමිතවී තිබුණි.

ආපසු පැමිණෙන මුස්ලිම් පවුල් කිහිපයකට රුපියල් 5,000 ක ගෙවීම ලැබී තිබුණි. කෙසේ වෙතත්, බොහෝ දෙමළ පවුල්වලට ඉහත සඳහන් රුපියල් 25,000 ක ගෙවීම ලැබී තිබුණු බවත්, ඔවුන්ට එසේ එය නොලැබුණු බවත් බොහෝ දෙනකු විසින් නිරීක්ෂණය කර තිබුණි. මෙමගින් දෙමළ බහුතරයක් සිටින උතුරු පළාතේ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සහ අනෙකුත් පරිපාලන කාර්යාලවල පවතින පක්ෂග්‍රාහී බව මෙයින් පිළිබිඹු කරන බව නැවත පැමිණි අය විසින් පවසන ලදි.

නෙරපා හැරීමට පෙර සාම්ප්‍රදායිකව තවත් මුස්ලිම් ප්‍රදේශයක් වූ සහිනගර් ප්‍රදේශය බලධාරීන් විසින් රජයේ ඉඩම් ලෙස ප්‍රකාශයට පත් කොට දෙමළ ජනතාව අතර බෙදා දී තිබේ. මුවර් වීදිය අරාලි පාර සමඟ මංසන්ධිය යනු මුලින්ම මුස්ලිම්වරුන්ට අයත්ව තිබූ භූමියකි. දැන්, එය වගා කිරීම සඳහා පමණක් වන කුඹුරු ඉඩමක් බව දිස්ත්‍රික් මහලේකම් කාර්යාලය කියා සිටී. ආපසු පැමිණි මුස්ලිම් පවුල් එය නැවත ලබා ගැනීමට උත්සාහ කළ නමුත් උසාවි නියෝග මගින් අවහිර කරනු ලැබ තිබේ.

අවතැන් වූ මුස්ලිම් පිරිමින් කිහිප දෙනෙකු යුද්ධය අවසන් වූ විගස 2009 දී ව්‍යාපාර සඳහා යාපනයට පැමිණ තිබේ. මෙම අවස්ථාවේදී ඔවුන් තමන්ගේ සහ අනෙකුත් මුස්ලිම් පවුල්වල යාබද ඉඩම් දෙමළ ජනතාවට විකුණා තිබේ. තම ඉඩම් විකිණීමෙන් වලක්වා ගනු පිණිස මුස්ලිම්වරුන් කිහිප දෙනෙක් ආපසු පැමිණ තිබේ.

**"ඇයි ඔයාලා ආපහු ආවේ?"**

නෙරපා හැරීමට පෙර දෙමළ සංස්කෘතියේ ඇතැම් අංග මුස්ලිම් ප්‍රජාවේ ජීවිතය සමඟ ඒකාබද්ධ වී තිබුණි. නෙරපා හැරීමට පෙර යාපනයේ දී විවාහ වූ ඇතැම් මුස්ලිම් කාන්තාවන්, ඔවුන්ගේ විවාහ මංගල්‍යවලදී තාලිය බැඳි බව ද සිහිපත් කරන ලදි. කාන්තාවන් ද දිනපතා ඇඳුමක් ලෙස සාරි ඇඳ සිටි අතර, සළුව පැළඳ සිටියේ උරහිස් මත පමණි. පුත්තලමට යාමට සිදු වූ විට පුත්තලමේ වෙසෙන මුස්ලිම්වරුන්ගේ ගතානුගතික ආගමික පිළිවෙත්වලට අනුකූලව මුහුණු ආවරණ පැළඳීම වැඩි විය.

මෙම මුස්ලිම් පවුල් 2010 දී නැවත යාපනයට පැමිණි විට, යුද්ධයෙන් පසු ඒ වන විටත් එහි නැවත පදිංචි වී සිටි ඇතැම් දෙමළ ජනයා අතර සැකයක් ඇති වී තිබුණි. **නෙරපා හැරීම පිළිබඳව නොදැන සිටි විවිධ පරිපාලන කාර්යාලවල නිලධාරීන් වන තරුණ පරම්පරාව "ඇයි ඔයාලා ආපහු ආවේ?" යැයි ඔවුන්ගෙන් විමසා තිබුණි. නෙරපා හැරීමට පෙර අර්ධද්වීපයේ මුස්ලිම් ජනගහනයක් සිටි බව පැරණි පරම්පරාවේ දෙමළ ජනයා හොඳින් දැන සිටියෝය. නමුත්, 'දෙමළ ජනතාවගේ ඉඩම් අත්පත් කර ගැනීමට'මුස්ලිම්වරු පැමිණි බව ඔවුන් තවමත් කියා සිටිති.**

*"එදිනෙදා ජීවිතයේදී, යාපනයේ දෙමළ සහ මුස්ලිම් ජනයා අතර අන්තර් ක්‍රියාකාරිත්වය සුහදයි. කෙසේ වෙතත්, කුඩා ප්‍රශ්නයක් පැනනඟින විටත්, ප්‍රජාවක් ලෙස මුස්ලිම්වරුන්ට ඉක්මනින්ම දොස් පැවරෙනවා. "*

මෑත කාලයේ එවැනි අවස්ථා කිහිපයක් ඇති වී තිබේ. 2019 අප්‍රේල් පාස්කු බෝම්බ ප්‍රහාරයෙන් පසුව දෙමළ ජනයා 'සියලු මුස්ලිම්වරු ඒ වගේ තමයි'කියමින් ඔවුන්ව ප්‍රචණ්ඩත්වයට වගකිව යුතු මරාගෙන මැරෙන බෝම්බකරුවන්ට සමාන කර තිබේ. ඇතැම් දෙමළ ජනයා මුස්ලිම්වරුන් 'අයිසිස්'ලෙස හඳුන්වන අතර, දෙමළ වෛද්‍යවරුන් පවා ඔවුන්ගේ මුස්ලිම් රෝගීන් පිළිබඳව ඒ හා සමාන අදහස් දක්වා තිබේ. අබායා සහ නිකාබ් පැළඳීම තහනම් කරමින් රෙගුලාසි සම්මත වූ විට කිසිවක් සඳහා පිටතට නොගොස් බොහෝ මුස්ලිම් කාන්තාවන් නිවසේම රැඳී සිටින ලදි. බිය හා අවිනිශ්චිතතාවය නිසා බොහෝ දෙනෙකු එතැන් සිට ඒවා පැළඳ නැත.

**ආපසු පැමිණීමේ අධික පිරිවැය**

**නැවත පැමිණීමට ගත් තීරණයෙහි ප්‍රතිඵලයක් වශයෙන්, පවුල් කිහිපයක්ම මේ මොහොතේ යාපනයට පැමිණීමට හෝ නොහැකි වූ තම ඥාතීන්ගෙන් සහ ආදරණීයයන්ගෙන් වෙන් වී සිටිති. පවුල් කිහිපයක් සඳහා, ඔවුන් ආපසු පැමිණීම අදහස මුළුමනින්ම බැහැර කර ඇති බවක් මෙයින් අදහස් නොකෙරේ. ඇතැම් අය ඔවුන් නැවත අවතැන්වීමේ තත්වයකට පත්වීමට අකමැති නිසා, නිවාස හා අවස්ථාවන් පිළිබඳව සහතිකවන තෙක් යාපනයේ යටිතල පහසුකම් සංවර්ධනය දෙස බලා සිටියි.**

*"නැවත පැමිණීම පහසු හෝ සෘජු ක්‍රියාවලියක් වූයේ නැහැ, ආපසු පැමිණි අපේ බොහෝ දෙනෙක් තවමත් සංක්‍රමණ තත්වයක ඉන්නේ."*

**නිවසක් ලැබීමේ ක්‍රියාවලිය ද ඉතා දුෂ්කර ය. පවුල අවට ඉඩමක ඉදිකරන ලද පැල්පතක හෝ කුලියට ගත් ස්ථානයක නිවස ඉදිකරන තුරු රැඳී සිටීම රජය විසින් අපේක්ෂා කරයි. කුඩා දරුවන් සමඟ නැවත පැමිණෙන පවුල් සඳහා මෙය විශේෂයෙන් දුෂ්කර ය. නිලධාරීන් පැමිණෙන විට ඔබ සිල්ලර බඩු කඩයකට හෝ පිටතට ගොස් තිබුණේ නම්, හෝ පිටතට ගොස් ඇති බව බලධාරීන්ට දැනගන්නට ලැබුනේ නම්, ඔබ 'පිටත්ව'ඇති බව ඔවුන් විසින් වාර්තා කරනු ඇත. ඔබ වෙනුවෙන් නිවසක් තැනීමේ ක්‍රියාවලිය එතැන් සිට නවතා දමනු ඇත.**

**දැන්, පවුලේ සාමාජිකයෙකු, ඥාතියෙකු හෝ මිතුරෙකු මිය ගියහොත්, එය දිගු ගමනක් වීම නිසා සහ තිබෙන ප්‍රවාහන පහසුකම් ද අනුව ඔවුන්ට තම ආදරණීයයන්ගේ අවමංගල්‍යය මඟ හැරේ. පැය 24 ක් ඇතුළත මුස්ලිම්වරුන් මියගිය අය භූමදාන කිරීම සිරිතක් වන නිසා පවුලේ සාමාජිකයන් කිහිප දෙනෙකුගේ අවමංගල්‍ය කටයුතු මගහැරීමට හෝ ප්‍රමාද වී පැමිණීමට සිදුවූ බව බොහෝ කාන්තාවන් විසින් පවසන ලදි. අවමංගල්‍යයකට, විවාහ මංගල්‍යයකට හෝ ආගමික උත්සවයකට වේවා යාපනය සහ අවතැන් වීමෙන් පසු ඔවුන් පදිංචි වී සිටි නගර අතර එකිනෙකා බැලීමට යාම සඳහා මෙම පවුල් සැලකිය යුතු පිරිවැයක් දරමින් සිටියි.**

රැකියා සඳහා අරගලය

පුත්තලමේ අවතැන් වී සිටි කාලය තුළ බොහෝ මුස්ලිම්වරුන්ට රැකියා කිරීම අභියෝගයක් විය. මිනිසෙකු යාපනයේ ත්‍රී රෝද රථ රියැදුරෙකු ලෙස සේවය කර ඇත්නම්, පුත්තලමේ දී ත්‍රී රෝද රථ රියදුරන් ඔහුට එම රැකියාවම කිරීමට හැමවිටම ඉඩ දෙන්නේ නැත. අවතැන් වූ බොහෝ මුස්ලිම් පිරිමින්ට හා කාන්තාවන්ට අඩු වැටුප් සඳහා කම්කරුවන් ලෙස වැඩ කිරීමට සිදු වූ අතර, සමහර විටක දී ඔවුන් සතියකට උපයන්නේ රුපියල් 600 ක් පමණි.

යාපනයට නැවත පැමිණෙන මුස්ලිම්වරුන් සඳහා රැකියා ලබා ගැනීම ද දුෂ්කර වී තිබේ. බොහෝ පිරිමින් පැරණි වානේ, ප්ලාස්ටික් සහ වෙනත් ද්‍රව්‍ය එකතු කරයි. ඔවුන් ඒවා ප්‍රතිචක්‍රීකරණය සඳහා හෝ කොළඹ වෙළඳසැල් හා කර්මාන්තශාලා වෙත විකුණයි. රැකියාව අතිශයින්ම දුෂ්කර වන අතර එයින් ඉතාම සුළු ආදායමක් පමණක් උපයා ගනී. පාස්කු බෝම්බ ප්‍රහාරයෙන් පසුව, අබලි ද්‍රව්‍ය එකු කිරීම සඳහා මුස්ලිම් පිරිමින්ට දෙමළ ප්‍රදේශ හරහා යෑමට ඉඩ දුන්නේ නැත.

අවතැන්වීම සිහිපත් කිරීම

අවතැන් වී සිටින විට තමන් ජීවත් වූ ප්‍රදේශවල වෙසෙන ජනයා තමන්ට හොඳින් සැලකූ බව කාන්තාවන් සිහිපත් කරයි. එක් කාන්තාවක් යාපනයේ සිට පූනරින් දක්වා ලොරි රථයකින් ගමන් කළ බවත්, පසුව පූනරින් සිට නාච්කුඩා දක්වා බෝට්ටුවකින් ගමන් කළ බවත්, ඔවුන් එක් රාත්‍රියක පල්ලියක නැවතී සිටි බවත් සිහිපත් කළාය.

1990 ට පෙර යාපනයේ මුස්ලිම්වරුන් මූල්‍යමය හා ආර්ථිකමය වශයෙන් යහපත් වූ බව ඔවුහු සඳහන් කරති. කෙසේ වෙතත්, නෙරපා හරින දිනයේ දී, පවුල්වලට තමන් සන්තක සියල්ල අතහැර දැමීමට සිදු විය. මිනිසුන් තම ඇඳුම්වල හෝ තමා තුළ සඟවා තබා ගෙන සිටි භාණ්ඩ තදින් පරීක්ෂා කළ එල්ටීටීඊය විසින් සියලුම වටිනා භාණ්ඩ රැගෙන යන ලදි. ඔවුන්ට අත්හැර දැමීමට සිදු වූ ඔවුන්ට හිමි ව තිබූ දේවල් හා දේපළ සඳහා වන්දි වශයෙන් ඔවුන්ට තවමත් කිසිවක් ලබා දී නැත.

මෙම පවුල්වලට යාපනයෙන් පිටත මුස්ලිම්වරුන් සමඟ කිසිදු සම්බන්ධයක් නොතිබුණි. මීට පෙර ව්‍යාපාරික කටයුතු සඳහා වෙනත් නගරවලට ගිය අයට පමණක් ඇතැම්විට සම්බන්ධතා තිබූ අතර, යාපනයෙන් ඉවත් කිරීමෙන් පසු තාවකාලිකව පවා රැඳී සිටීමට ස්ථාන සොයන විට ඒවා ඔවුන්ට උපකාර විය.

පුත්තලම වෙත ළඟා වූ විට සමහරුන් පාසැල්වල නැවතී සිටි අතර මුස්ලිම් පල්ලි වලින් ඔවුන්ට ආහාර ලබා දෙන ලදි. අනුරාධපුරයට පැමිණි සමහරුන්ට තව දුරටත් දකුණට ගිය පවුල් සමඟ සම්බන්ධ වීමට හැකි විය. ඔවුන් කඳවුරුවල හා මුස්ලිම් පල්ලිවල නැවතී සිටියදී, සෑම කෙනෙකුම නිදා ගැනීම, සේදීම සහ වැසිකිලියට යාම පෙනෙන මානය තුළ සිදුකල යුතු විය.

කාන්තාවන්ට, තම පවුල්වල නොවන පිරිමින් සමඟ මෙම ක්‍රියාකාරකම්වල යෙදීමට සිදුවීම ඔවුන් හැඩගැසිය යුතු ඉතා අම්හිරි යථාර්ථයක් විය. එක් අවස්ථාවක දී පවුල් 40 කට එක් ඉඩමක නවාතැන් ගෙන සිටීමට සිදු වූ අතර එහි

දී භාවිතය සඳහා තිබුණේ වැසිකිළි 4 ක් හා ළිං දෙකක් පමණි. ඔවුන් තම අවසාන ගමනාන්ත කරා යන විට, පවුල් එකිනෙකාට උදව් කරගනිමින්, නව නගරවල නිවාස ඉදිකරන ලදි.

එම ප්‍රදේශවල ජනතාව ඔවුන් ගැන කතා කරන විට 'ඔවුන් අවතැන් වී සිටින' බව ඔවුන්ට නිරන්තරයෙන් මතක් කරනු ලැබේ.

අනාගතය දෙස බැලීම

නෙරපා හැරීමට පෙර මුස්ලිම් ප්‍රදේශයේ පාසල් පහක් ක්‍රියාත්මක විය. ඒවායින් නැවතත් විවෘත කර ඇත්තේ උස්මානියා විද්‍යාලය සහ කදීජා පාසල පමණි. උස්මානියා විද්‍යාලයේ උසස් පෙළ පන්ති ලබා දී ඇත්තේ වසරක් සඳහා පමණි. කදීජා සාමාන්‍ය පෙළ දක්වා පමණක් පන්ති පවත්වන අතර සිසුන් අධ්‍යාපනය අවසන් කිරීම සඳහා දෙමළ පාසල් වෙත මාරු විය යුතුය.

ඇතැම් දෙමව්පියන් උපකාරක පන්ති සඳහා හෝ ඔවුන්ගේ දරුවන් සඳහා තම නිවෙස්වලට සමීපව පිහිටා නැති පන්තිවලට යාමට අමතර මුදල් වියදම් කිරීමට මැලිකමක් දක්වයි. එබැවින් මුස්ලිම් පිරිමි ළමයින් රැකියාවන් සඳහා යන අතර බොහෝ කුඩා දරුවන් ද මත්ද්‍රව්‍යවලට සම්බන්ධ වී තිබේ.

මේ මොහොතේ මුස්ලිම් කාන්තාවන් මුහුණ දෙන සමාජ ගැටලු පිළිබඳව කාන්තාවන් විසින් කතා කරන ලදි. සමාජයීයව ඉදිරිපත්වීමට සිදුවන නිසා කාන්තාවන් ඕනෑවට වඩා ඉගෙනීම නොකළ යුතු බවත්, අධිකාරී තනතුරු නොදැරිය යුතු බවත් ප්‍රජා නායකයින් සහ ආගමික නායකයින් පවසයි.

නෙරපාහැරීම සහ එහි ඇඟවුම් පිළිබඳ සාකච්ඡා කිරීම සඳහා විද්වතුන්, ලේඛකයින් සහ ශාස්ත්‍රඥයින් විසින් කැඳවනු ලැබූ ජනතා සංසදය සහභාගීවීමට ප්‍රජාවට හැකි විය. කෙසේ වෙතත්, ඔවුන්ගේ ගම්වල ජීවත්වන අයත් සමඟ ඒ ආකාරයේ මාතෘකා ගෙන යා නොහැකි බව ඔවුහු දනිති.

*"නෙරපා හැරීම අත්විඳ නැති පරම්පරාවෙන් පැමිණි කුඩා දරුවන් මේ ගැන උනන්දුවක් දක්වන්නේ නැහැ, ඇත්ත වශයෙන්ම ප්‍රජාවේ ඉතිහාසය ගැන අපි වැඩිහිටියන්ගෙන් විමසන්නේ නැහැ. ඔවුන් බොහෝ දෙනා උපත ලැබුවේ දකුණේ සහ ප්‍රජාව අවතැන් වී සිටි ප්‍රදේශවල දී නිසා ඔවුන්ට උතුරට කිසිදු සම්බන්ධයක් දැනෙන්නේ නැහැ. "*

ඡන්දය ප්‍රකාශ කිරීම සඳහා ප්‍රජාව ලියාපදිංචි වී ඇත්තේ යාපනය දිස්ත්‍රික්කයේය. මැතිවරණය ළං වන විට, ඡන්දය ප්‍රකාශ කිරීම සඳහා 'ගෙදර'පැමිණීම වෙනුවෙන් ආපසු පැමිණි අය වෙනත් තැන්වල ජීවත්වන තම පවුලේ අය හා මිතුරන් සමඟ සම්බන්ධ වේ. මෙම ගමන සඳහා සෑම කෙනෙකුටම හැකියාවක් හෝ තේරීමක් කළ නොහැකිය.

නෙරපා හැර වසර 30 ක් ගතවී ඇති අතර, අවතැන් වූ දා සිට බොහෝ අය තමන් ජීවත් වූ ප්‍රදේශවල ඉඩම් නැවත අත්පත් කරගෙන හෝ මිලදීගෙන තිබේ. යාපනයේ පිහිටි ඔවුන්ගේ උපන් බිමට නැවත පැමිණීම යන්නෙන් අදහස් වන්නේ ඇතැම්විට ආණ්ඩුවේ සහය ද නොමැතිව ඔවුන්ගේ ජීවිත යළිත් වරක් ආරම්භ කිරීමකි.



# මුලතිව්

**1990 දී උතුරු පළාතෙන් නෙරපා හරින ලද මුස්ලිම් පවුල් අතර මුලතිව් මුස්ලිම් පවුල් 1,000 ක් ද විය. කාලය ගෙවී යත්ම නව පරම්පරාවන් සමඟ ප්‍රජාවේ ජනගහනය වැඩිවන විට එම සංඛ්‍යාව පවුල් 5,000 ක් දක්වා වර්ධනය වී තිබේ.**

**නැවත සිය මුල්බිමේ පදිංචි වී සිටින පවුල් සඳහා අවකාශය, නිවාස හා ජලය ප්‍රධාන ගැටලු ලෙස පවතී. සම්පත් හා අවකාශය නොමැතිකම දුටු පවුල් පුත්තලමේ සහ ඔවුන් අවතැන් වූ වෙනත් ප්‍රදේශවලම රැඳී සිටීමට තීරණය කර තිබේ. ඔවුන් මුලතිව්වල ලියාපදිංචි වී ඇති නමුත් ලියාපදිංචි මුස්ලිම් පවුල් 2,000 න් අඩක් පමණක් දැනට දිස්ත්‍රික්කයේ වෙසෙති.**

***"වෙනත් අය ආපසු නොපැමිණීමට තීරණය කළේ දශක දෙකකට ආසන්න කාලයක් අවතැන් වීමෙන් පසුව ඔවුන් පුත්තලම සහ වෙනත් ප්‍රදේශවල මුල් බැස තිබීම නිසායි. මුලතිව් සිට පිටත්ව ගිය අය පුත්තලමේ සහකාරියන් හෝ සහකරුවන් සමඟ විවාහ වී එහි පවුල් ආරම්භ කර එහි රැකියා හා ව්‍යාපාර ආරම්භ කර තියෙනවා."***

දැන් මුලතිව් හි වෙසෙන මුස්ලිම්වරුන් තමන්ගේම යැයි පැවසිය හැකි ස්ථානයකට නැවතත් පැමිණීම පිළිබඳව සතුටු වෙයි. ඇතැම් අවස්ථාවල, පවුලක ශාඛා සියල්ලම නැවත පැමිණ සිටී. එයින් අදහස් වන්නේ සමහරුන්ට ඔවුන්ගේ ඥාතීන් සියල්ලන්ම එකට සිටින බවයි. නෙරපා හැරීමට පෙර, පොල් අතු නිවාසවල බොහෝ දෙනා ජීවත් වූ ආකාරය කාන්තාවන් විසින් සිහිපත් කරනු ලැබීය. දැන්, නිවාස ව්‍යාපෘති මගින් හෝ ඔවුන්ගේම පවුලේ වියදම් හරහා බොහෝ දෙනෙකු වඩාත් නවීන නිවාසවල ජීවත් වේ. පෞද්ගලික පරිත්‍යාගශීලීන් හරහා කෘෂිකර්මාන්තයේ භාවිතය සඳහා ළිං හා ජල නල තැනීමට ඔවුන්ට හැකි වී තිබේ.

රැකියාවක් සොයා ගැනීමට අපහසු වීම වැනි ගැටලු කිහිපයක් ඔවුන්ට තවමත් තිබේ. විශේෂයෙන් කාන්තා ගෘහ මූලික පවුල් සඳහා ආර්ථික තත්වය වඩාත් දුෂ්කර ය. බොහෝ දෙනෙක් විසඳුමක් ලෙස සහ ඔවුන්ගේ පවුල් පෝෂණය කිරීම සඳහා විදේශයන්හි රැකියාවක් සොයා ගිය නමුත් පසුගිය අප්‍රේල් මාසයේ පාස්කු ඉරිදා ප්‍රහාරයෙන් පසු එය තවදුරටත් විකල්පයක් නොවේ.

නව අරගලයකට නැවත පැමිණීම

මුලතිව් වෙත නැවත පැමිණෙන අයට ඇති එක් ප්‍රධාන අභියෝගයක් වන්නේ ඔවුන්ගේ ඉඩම් සහ නිවාස ලබා ගැනීම සඳහා රජයේ හා පරිපාලන නිලධාරීන් සමඟ සම්බන්ධවීමයි. දෙමළ ග්‍රාම සේවා නිලධාරීන් මුලතිව් දිස්ත්‍රික්කයේ මුස්ලිම්වරුන් ලියාපදිංචි කිරීමට මැලි කමක් දක්වනබව කාන්තාවන් පවසයි. බොහෝ විට, ගෙයින් ගෙට ගොස් මිනිසුන් සැබවින්ම ඒවායේ වාසය කරන්නේ ද යන්න ඔවුන් විසින් පරීක්ෂා කරනු ලැබේ. අවස්ථා කිහිපයක දී, නිවැසියන් මෑතක දී නිවසේ ආහාර පිසනු ලද්දේ දැයි බැලීමට නිලධාරීන් විසින් උණුසුම් බව පරීක්ෂා කිරීමට ලිප සහ දර ද පරීක්ෂා කර ඇති බව වාර්තා වේ.

යමෙකුට ග්‍රාම නිලධාරියාගෙන් ලිපි හෝ සහතික කිරීමක් අවශ්‍ය නම්, පුත්තලමේ නිලධාරීන් මෙම ලේඛන අවතැන් වූ මුස්ලිම්වරුන්ට නිකුත් නොකරන නිසා ඔවුන් ඒ සඳහා මුලතිව් වෙත ගමන් කල යුතුය. 2020 අගෝස්තු පාර්ලිමේන්තු මැතිවරණයේ දී පුත්තලමේ වෙසෙන අයට දිගු ගමනක් නොයා තම මුලතිව් නියෝජිතයාට ඡන්දය ප්‍රකාශ කිරීම සඳහා තාවකාලික විධිවිධාන යොදා තිබුණි. බොහෝ අය තම ඡන්දය ලියාපදිංචි කිරීම පුත්තලමට වෙනස් කිරීමට කැමති නැත.

ඉඩම් සංවර්ධන ආඥා පනත (LDO) යටතේ බොහෝ පවුල්වලට ඔවුන්ගේ නිවෙස්වල සිට කිලෝමීටර කිහිපයක් දුරින් කෘෂිකාර්මික ඉඩම් තිබුණි. ඔවුන් ආපසු පැමිණි විට, නැවතත් වගා කටයුතු ආරම්භ කිරීම සඳහා තම බලපත්‍ර අලුත් කිරීම වෙනුවෙන් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට ගොස් තිබුණි. කෙසේ වෙතත්, එහිදී නැවත නැවතත් ප්‍රශ්න කිරීම හා පරීක්ෂා කිරීමෙහි යෙදෙන නිලධාරීන් විසින් මෙම ක්‍රියාවලිය දීර්ඝ කොට තිබේ. මීට වසර හතකට පෙර අයදුම්පතක් ඉදිරිපත් කිරීමෙන් පසුව ද, තම බලපත්‍ර අලුත් කරන තෙක් තවමත් බලා සිටින පවුල් තිබේ.

තවත් අවස්ථාවල දී, මෙම කෘෂිකාර්මික ඉඩම මිශ්‍ර බලපත්‍ර හෝ මිශ්‍ර හිමිකාරිත්වය යටතේ තිබූ ඒවා වේ. ඔවුන් ආපසු පැමිණි විට, ඒවා දැන් වනාන්තර ඉඩම් ලෙස වෙන් කර ඇති බවත් ඔවුන්ට ඒවායෙහි පදිංචි වීමට නොහැකි බවත් ඔවුන්ට දන්වා තිබේ. මේ ඉඩම්වල දැන් පදිංචිව සිටින සහ ජීවත්වන දෙමළ ජනතාවට එය අදාළ නොවන බව

**පෙනේ. භූමිය වනාන්තරයක් ලෙස නම් කරන ලෙසත්, ගල් සලකුණු එහි තබන ලෙසත්, ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ නිලධාරීන් වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ට බලපෑම්කර ඇති බව ප්‍රජාවට අවසානයේ දැන ගන්නට ලැබුණි.**

***"මෙම ගැටලු මැද වුණත් අපි ආවා. මුලතිව්වල අපිට අපේම කියන්න පුළුවන් ඉඩම් තියෙනවා. අවතැන් වී සිටි ස්ථානවල දී අපිට අපේ ඉඩමක් මිල දී ගන්නවත් කුලියට ගන්නවත් බැරි වුණා. අපි 'අපේ තැනට' ආවා. එහෙම කරන එක අපේ අයිතිය. "***

ඔවුන්ගේ පවුල්වල ඇතැම් අය තවමත් උතුරු පළාතෙන් පිටත ප්‍රදේශවල ජීවත් වේ. ස්වභාවිකවම, විවාහ මංගල්‍යයන් සැමරීමට හෝ අසනීප අවස්ථාවක දී උපකාර ලබා ගැනීමට ඔවුන්ට එකිනෙකා බැලීමට අවශ්‍ය වනු ඇත. මෙම කාරණා සඳහා දැරිය යුතු ගමන් වියදම් බොහෝ විට තරමක් ඉහළ විය හැකියි.

2012 දී ආපසු පැමිණි කාන්තාවන් දීර්ඝකාලීන අවතැන්වීම සඳහා යෝජිත ලේකම් කාර්යාලයේ කොමසාරිස්වරුන් සමඟ කටයුතු කිරීම පිළිබඳව සිහිපත් කරනු ලැබීය. මෙම කාර්යාලයේ පළමු ප්‍රමුඛතාවය විය යුත්තේ මුස්ලිම් අවතැන් වූවන් ය. කෙසේ වෙතත්, 2019 දී කැබිනට් මණ්ඩලය වෙනස් වූ විට, නිවාස හා නිවාස යෝජනා ක්‍රම සඳහා ගෙවීම් නතර විය. ආපසු පැමිණි ඕනෑම මුස්ලිම් පවුලක් සඳහා නිවාස ලබා දීම වෙනුවෙන් රුපියල් 792,000 ක් වෙන් කර ඇති බව වාර්තා වන නමුත් එතෙක් භාවිතා කර තිබුණේ රු. 200,000 ක් පමණි. ලේකම් කාර්යාලය ක්‍රියා විරහිත වූ අතර දීර්ඝකාලීන අවතැන්වීම් සඳහා වූ ප්‍රතිපත්තිය කිසි විටෙකත් යථාර්තයක් බවට පත් වූයේ නැත.

තමන්ට සහ ඔවුන් දන්නා තවත් බොහෝ මුස්ලිම් පවුල්වලට වන්දි ගෙවීමේ කාර්යාලයෙන් කිසිදු සහයෝගයක් ලැබී නොමැති බව එම කාන්තාවන් පවසයි. ආපසු පැමිණෙන සියලුම පවුල් වන්දි සහ නැතිවූ වත්කම් ආපසු ලබා ගැනීමට ඉල්ලා ඇතත් කිසිවක් ලැබී නැත.

අවතැන් වී වසර තිහකට වැඩි කාලයක් තිස්සේ මුස්ලිම් ප්‍රජාවේ වැඩි වූ ජනගහනයට ඉඩ සැලසීමට මුලතිව් හි ඇති භූමිය දැන් ප්‍රමාණවත් නොවේ. 2012 දී ඔවුන් නැවත උතුරට පැමිණි දා සිට මුස්ලිම්වරුන් කිහිප වතාවක්ම ඉඩම් කච්චේරි වෙත ගොස් තිබේ. ඔවුන් මෙම ක්‍රියාවලියට සහභාගීවීම පිළිබඳව දෙමළ ජනතාව විරෝධය පළකර තිබේ.

මෙහි කිසිදු විසඳුමක් නොතිබූ මුස්ලිම්වරුන් තම ඉඩම් හෙළිකර නැවතත් එහි වාසය කිරීම හා වගා කිරීම ආරම්භ කරන ලදි. එයට එරෙහිව විරෝධතා දෙකක් පැවති බවත්, විරෝධතාකරුවන් අතර යාපනය විශ්ව විද්‍යාලයේ සිසුන් ද සිටි බවත් කාන්තාවන් පවසයි. මුලතිව් දෙමළ ජනතාවට පමණක් අයිති බව විරෝධතාකරුවන් විසින් පවසන ලදි. ඊට අමතරව, බංකර ඉදිකිරීම සඳහා භාවිතා කිරීමට අදහස් කරමින් එල්ටීටීඊය විසින් තෝක්ක ගස් සිටුවනු ලැබූ ප්‍රදේශවලට ආසන්නව මුස්ලිම්වරුන්ට පදිංචි වීමට ඉඩ නොදෙන ලෙස ඔවුන් බලධාරීන්ට බලපෑම් කරන ලදි. අද දක්වාම, පුත්තලම් සිට මුලතිව් ඉඩම් කච්චේරි වෙත නැවත ඔවුන්ගේ ඉඩම් ඉල්ලා මිනිසුන් පැමිණෙයි, බොහෝ දෙනෙකුට මේ සම්බන්ධයෙන් තවමත් විසඳුමක් නැත.

මුලතිව් වෙත ආපසු පැමිණ දශකයකට ආසන්න කාලයකට පසු පුද්ගලයින් 25 දෙනෙකුට රජයේ ඉඩම් ලබා දී තිබේ. 1990 ට පෙර, පර්චස් 80 ක ඉඩමක් තමන්ටම තිබුණු, විශාල ගෙවතු සහිත නිවාසවල ජීවත් වූ ඇතැම් පවුල් තිබුණි.

දැන් පවුල් හයක් පමණ එම ප්‍රමාණයේ එක් ඉඩමක් බෙදාගෙන ජීවත්වනු දැකිය හැකිය. මුස්ලිම්වරුන්ට නිවසකට පර්චස් හතක් වෙන් කරන විට දෙමළ ජනතාවට අක්කර ½ යක් ලැබුණු බවත් ඔවුහු සඳහන් කරති.

යුද්ධය අවසන්වීමෙන් පසු 2010 දීම බොහෝ මුස්ලිම්වරුන් ඉඩම්වල අයිතිවාසිකම් ඉල්ලා පැමිණ තිබේ. ලියාපදිංචිය සිදු කරන විට, මැණික් ෆාම් සරණාගත කඳවුරෙන් ආපසු පැමිණෙන දෙමළ පවුල් සඳහා ප්‍රමුඛතාවය ලබා දෙන ලදි. ඔවුන් සියල්ලන්ම පදිංචි වී සරණාගත කඳවුර වසා දැමීමෙන් පසු මුස්ලිම්වරුන්ට නැවත පැමිණීම සඳහා ලියාපදිංචි වීම සඳහා අවස්ථාව විවෘත විය. ඔවුන් ආපසු එන විට, ඔවුන් විසින්ම සියල්ල සකස්කර ගන්නා ලදි. රජයෙන් ඔවුන්ට ලැබුණු එකම සහයෝගය වූයේ මාස හයකට වැඩි කාලයක් සඳහා වියළි සලාකයක් ලැබීමයි.

උපකාර ලබාදුන් අයගේ ආධාරයෙන් ඉඩමක් මිල දී ගැනීමට හැකිවන තෙක් තමන් අන් අයගේ ඉඩම්වල පොල්අතු පැල්පත්වල ඉදිකරගනිමින් ස්ථාන දහයකට පමණ මාරුවෙමින් සිටි බව 2010 දී ආපසු පැමිණි එක් කාන්තාවක් පැවසුවාය. ඉඩමක් මිලදී ගැනීම වෙනුවෙන් ඇය සතුව තිබූ ස්වර්ණාභරණ සියල්ලම උකස් කළ බව තවත් අයෙක් පැවසුවාය.

**නෙරපා හැරීම් පිළිබඳ මතකයන්**

නෙරපා හැරීමට පෙර මාස කිහිපය තුළ ප්‍රජාවට අවිනිශ්චිතභාවයක් දැනුණි. පවුල් කිහිපයක් ඔවුන්ගේ වටිනා ලියකියවිලි පෙට්ටියක එක්රැස් කර, අවශ්‍යතාවය කවදා හෝ ඇති වුවහොත් පිටත්ව යාමට සූදානම්ව සිටින ලදි. එතරම් සූදානම් නොවූ අනෙක් අයට පිටත්ව යෑමේ දී තමන්ගේ ලියකියවිලි සහ සහතික අහිමි විය.

ඔවුන් උතුරේ සිට පා ගමනින් යන විට අතරමඟ දී දරුවන් ඉපදීමේ සිදුවීම් කාන්තාවන් විසින් සිහිපත් කරන ලදි. ඔවුන්ගේ මව්වරුන් වනාන්තර තුළ දී ඔවුන්ව බිහි කොට තිබුණි. මෙම දිගු ගමනේ දී ඔවුන් දෙමළ නිවාසවලින් පානීය ජලය ඉල්ලා සිටියත් ඇතැම් ස්ථානවල දී ඔවුන්ව ප්‍රතික්ෂේප කොට තිබුණි.

***"අපි වටිනා කිසිවක් ගෙනයනවාදැයි බලමින් උතුරු පළාතේ මායිම දක්වාම එල්ටීටීඊ සාමාජිකයින් ආරක්ෂාවට හිටියා. අපේ ගමේ එක් කාන්තාවක් ඇගේ ආභරණ ඇගේ ඇඳුම්වල මහගෙන යන්න හැදුවා. ඒ අය අපිව තදින්ම පරීක්ෂා කර බැලූ නිසා ඒ සියල්ල ඇයගෙන් ලබා ගත්තා."***

වවුනියාවට පසුව තිබෙන ගම්වල වෙසෙන මුස්ලිම් අය අවතැන්වූවන්ගේ රථවාහන පෙළට උපකාර කිරීමට පැමිණ තිබේ. ශ්‍රී ලංකා හමුදාව ඔවුන්ව විවිධ කඳවුරුවලට හෝ ඔවුන්ගේ ගමනාන්ත වෙත ප්‍රවාහනය කිරීම සඳහා නොමිලේ ලොරි රථ සංවිධානය කර තිබුණි. කෙසේ වෙතත්, ලොරි රියදුරන් අවතැන්වූවන්ගෙන් මුදල් ඉල්ලා ඇති බවක් පෙනෙන්නට තිබුණි.

ඔවුන් ආපසු පැමිණි වසර කිහිපය තුළ, මුස්ලිම් ප්‍රජාව තමන්ගේ ඉවත් කිරීම සිහිපත් කිරීම සඳහා ඔක්තෝබර් 30 වන දින කිසිදු සාමූහික සැමරුමක් පවත්වා නොතිබුණි. එවැනි සිදුවීමක් උතුරේ දෙමළ හා මුස්ලිම් ප්‍රජාවන් අතර සබඳතාවලට බලපානු ඇතැයි සහ අනවශ්‍ය කරදර ඇති කරනු ඇතැයි යන බිය නිසා කිසිදු අනුස්මරණයක් සංවිධානය කිරීමේ වගකීම භාර ගැනීමට කිසිවෙකු කැමති වී නැත.

2002 දී සටන් විරාමය ප්‍රකාශයට පත් කරන විට මුස්ලිම්වරුන්ට තම ඉඩම් සඳහා නැවතත් පැමිණිය හැකි බවට ගිවිසුමක් ඇති විය. පවුල් කිහිපයක් ආපසු පැමිණි විට, එල්ටීටීඊයේ අවසරය ඇතිව දෙමළ ජනයා තම නිවෙස්වල වාසය කරන බව ඔවුන්ට දක්නට ලැබුණි. එල්ටීටීඊ සාමාජිකයින්, නිලධාරීන් සහ ඔවුන්ගේ පවුල්වල සාමාජිකයින් ද මුස්ලිම් නිවාසවල පදිංචිවී තිබුණි.

2019 පාස්කු බෝම්බ ප්‍රහාරයෙන් පසුව, පුත්තලමේ ජනතාවට මුලතිව් දිස්ත්‍රික්කයේ ඥාතීන් සමඟ නැවතී සිටීමට හෝ දිස්ත්‍රික්කය තුළ ජීවත් වීමට ලියාපදිංචි විය නොහැකිය. ආපසු පැමිණි බොහෝ දෙනෙකුට පුත්තලමේ ලිපිනයන් සහිත ජාතික හැඳුනුම්පත් තිබූ අතර ඒවා වෙනස් කරගන්නා ලෙස හමුදාව විසින් ඉල්ලා තිබුණි. මෙම නව ජාතික හැඳුනුම්පත් සඳහා ඡායාරූප ගැනීමට ඡායාරූපාගාර වල පිරිස් රැස්වී සිටි ආකාරය ද ඇතැම් කාන්තාවන් විසින් සිහිපත් කරන ලදි.

ඔවුන් 2012 දී ආපසු පැමිණෙන විට හමුදාව විසින් මුස්ලිම් ප්‍රජාව සෝදිසි කිරීමක් නොතිබුණද, බෝම්බ ප්‍රහාරයෙන් පසුව දැඩි සෝදිසි කිරීම් ආරම්භ විය. නිවාස නිරන්තරයෙන් පරීක්ෂා කරනු ලබන අතර බොහෝ පවුල් එකල සංචාරය කිරීමට ද බිය විය. කුරානය තිබීම නිසා ද මිනිසුන් අත්අඩංගුවට පත්විය - අත්අඩංගුවට ගැනීමෙන් වළක්වා ගැනීම සඳහා පවුල් කිහිපයක්ම ඉස්ලාමයේ ශුද්ධ පොතේ පිටපත් පුළුස්සා දමන ලදි.



**සම්බන්ධ වීම් සහ නැවත සම්බන්ධ වීම්**

**ඔවුන් ආපසු පැමිණෙන විට දෙමළ ප්‍රජාව ඒ පිළිබඳව සතුටු නොවූ බව කාන්තාවන් විසින් සඳහන් කරන ලදි. ඔවුන් මුස්ලිම්වරුන් 'පුත්තලම් ජනතාව'ලෙස හැඳින්වූ අතර ඔවුන් සමඟ සිනාසීම හෝ කතා කිරීම නොකරන ලදි. එය මුස්ලිම්වරුන්ට ඔවුන්ගේ එදිනෙදා ජීවිතයේදී කිසිදු ගැටලුවක් ඇති නොකළ නමුත් ඔවුන් එය ඔවුන්ගේ මනසෙහි බරක් ලෙස දරාගෙන ඉදිරියට යන ලදි. කුඩා දරුවන් සැඟවී මේ පවුල් දෙස බලා සිටි අතර තම වැඩිහිටියන්ගෙන් මේ අය කවුරුන්දැයි විමසන ලදි. මෙම දරුවන් මීට පෙර මුස්ලිම් ජනතාව ගැන දැන සිටියේ හෝ ඔවුන්ව දැක තිබුණේ නැත. 'මේ අය මුස්ලිම් ජනතාව; ඔවුන් අදිනෙන් පළඳින්නේ මෙහෙමයි'** කියා සමහර වැඩිහිටියන් ඔවුන්ට **පැහැදිලි කර දෙන්නට ඇත.**

දෙමළ ජනතාව සමඟ ප්‍රජාවගේ සබඳතා වසර ගණනාවක් පුරා දියුණු වී තිබේ. නෙරපා හැරීම, අවතැන්වීම පිළිබඳ ඔවුන්ගේ අත්දැකීම් ගැන ඔවුන්ට කතා කළ හැකි වූ අතර බොහෝ අයට එය තේරුම් ගැනීමට හැකි වී තිබේ. එල්ටීටීඊයේ ප්‍රචණ්ඩත්වය දුටු හෝ අත්විඳින දෙමළ ජනතාව ඔවුන්ගේ අරගලය පිළිබඳව සංවේදීවී තිබේ. එවැනි පුද්ගලයින් සමඟ සබඳතා ගොඩනඟා ගැනීම ප්‍රජාවන් දෙක අතර යම් බැඳීමක් ඇති කිරීමට උපකාරී වේ.

එල්ටීටීයී ව්‍යාපාරය පිළිබඳව සානුකම්පිත පුද්ගලයන් සමඟ ඔවුන්ගේ ගැටලු මතු කිරීම තවමත් දුෂ්කර ය - ඔවුන්ගේ මුහුණේ ඉරියව් වෙනස්වීම් අනුව එය තවමත් කතා කිරීම නොකළ යුතු මාතෘකාවක් බව කාන්තාවන් පවසයි.

නෙරපා හැරීමට පෙර මුලතිව් හි දෙමළ හා මුස්ලිම් ප්‍රජාවන් සමීපව සිටින ලදි. එල්ටීටීඊයට මුස්ලිම් පවුල් විසින් ආහාර සැපයූ අතර නිලධාරීන් සහ ඔවුන්ගේ පවුල් සමඟ අදහස් හුවමාරු කර ගැනීම ද සිදුවිය. ඇත්ත වශයෙන්ම, එල්ටීටීඊයේ අයිතිවාසිකම් පිළිබඳ ප්‍රසිද්ධ කතිකාව මඟින් මුස්ලිම්වරුන්ව දිරිගැන්වූ ආකාරය ද කාන්තාවන් විසින් සිහිපත් කරන ලදි. සංවර්ධනය වටා ඇති සංවාදයට හා විශ්ව විද්‍යාලවලට ඇතුළුකර ගැනීමේ කෝටා ක්‍රමයේ පවතින වෙනස්කොට සැළකීම පිළිබඳ සංවාදවලට ප්‍රජාවන් දෙකම එකල සම්බන්ධ විය.

***"යුද්ධය අවසන් වූ දා ඉඳලා රට පුරාම සංහිඳියාව හා සංක්‍රාන්ති යුක්තිය පිළිබඳව සාකච්ඡා කර තිබෙනවා. කෙසේ වෙතත්, මෙම අදහස් හා යාන්ත්‍රණ මුස්ලිම් ජනතාවට අදාල වෙන්නේ නැති බව පේනවා. "***



# පුත්තලම

### අවතැන්වීමේ අභියෝග

පුත්තලම බලා යන අතරමග දී අවතැන් වූවන් පාසල්වල නැවතී තිබේ. වැඩි සංඛ්‍යාවක් සිටින විට ලැබෙන ආරක්ෂාව බලාපොරොත්තුවෙන් කාන්තාවන් එකට එකතු වී, නාන කාමරවලට ගොස් තිබුණි. නොච්චියාගම පාසලක සිටි කාලය තුළ ඔවුන් සියල්ලන්ම එකතු වී ගසක් යට ආහාර පිසගෙන තම පවුල් අතර බෙදා ගෙන තිබුණි.

ඔවුන් මුලින්ම පුත්තලමට පැමිණි විට, මනල්කුන්ඩු කඳවුරේ එකට එකතු වී සිටි ආකාරය කාන්තාවන් විසින් සිහිපත් කරන ලදි. සියලුම පවුල් එකට ජීවත්වන නිසා, කුඩා අවකාශයක සිරවී සිටින විට පිරිමින්ගෙන් පැමිණි අනවශ්‍ය අවධානයන් ඔවුන්ට දරා ගැනීමට සිදු විය.

***"අවතැන්වීම පිළිබඳ අපගේ අත්දැකීම් බොහෝ තලයන්ගේ අරගලයන්ගෙන් පිරී තිබුණා. අපේ පවුල් පෝෂණය කරන්න උපයා ගන්න පුළුවන් හැම වැඩක්ම අපි කළා. නව ස්ථානයකට හුරුවීමත් සමඟම අපේ දරුවන් බලා ගැනීම සහ රැකබලා ගැනීමේ අමතර වැඩ කටයුතුත් අපි කළ යුතුයි. "***

එකල සෑම පවුලකටම ලැබුණු එකම ආධාරය වූයේ ලෝක ආහාර වැඩසටහනෙන් මාසිකව ලැබුණු රුපියල් 630ක කූපනයක් සහ සහල් කිලෝග්‍රෑම් 30 කි. අමතර අවශ්‍ය දේවල් සඳහා මුදල් උපයා ගැනීමට සහල් කිලෝග්‍රෑම් 15 ක් විකුණන බවත්, ඉතිරි කොටස ඔවුන්ගේ පවුල්වලට ආහාරයට ගත හැකි ආකාරයට පිස ගත් බවත් කාන්තාවෝ පවසති.මෙම ආධාරය සහ රතු කුරුස සංවිධානයෙන් ලැබුණු කුඩා ආධාර 1992 දී පමණ මුළුමනින්ම නතර වීම දක්වා ලබා දෙන ලදි.

1990 ට පෙර ව්‍යාපාරික සම්බන්ධතා තිබූ පවුල්වලට උතුරෙන් පැමිණෙන විට එසේ නොමැති අයට වඩා මදක් පහසුවෙන් පදිංචි වීමට හැකිවිය. කල්පිටියේ සහ පුත්තලමේ සබඳතා තිබූ මුස්ලිම් ව්‍යාපාරිකයින්ට ඔවුන්ගේ පවුල් සඳහා වඩා හොඳ නවාතැන් සොයා ගැනීමට හැකි විය.

ළමයින්ගේ පාසල් අධ්‍යාපනය බිඳ වැටීම නෙරපා හැරීමේ විශාලතම බලපෑම්වලින් එකක් විය හැකි බව පුත්තලමේ කාන්තාවන් පවසන ලදි. නිදසුනක් වශයෙන්, මන්නාරමේ පිහිටි සිය ගම්බිම්වල දෙමළ පාසල්වල 7 වන ශ්‍රේණියේ ඉගෙනුම ලැබූ සිසුන්ට දැන් පුත්තලමේ හි සිංහල පාසල්වල 3 ශ්‍රේණියට ඇතුළු වීමට සිදු වී තිබේ. ඊට අමතරව, ඔවුන් ජීවත් වූ ස්ථානවල සිට පාසල්වලට යාමේ දුෂ්කරතාව නිසා බොහෝ ගැහැණු දරුවන්ට කලින් පාසැල් යාම අවසන් කිරීමට සිදුව තිබේ. ඇතැම් අයට පාසැලට යෑම සඳහා කිලෝමීටර් හතරක් තරම් දුර මාර්ගයක ඇවිදීමට සිදුව තිබුණි.

**ප්‍රදේශයේ මුල් බැස ගැනීම**

ගෙවී ගිය දශක තුන තුළ, මුලින්ම පුත්තලමට පැමිණි අවතැන් වූ පවුල් සියල්ලම පාහේ ඉඩම් මිලදී ගෙන ඇති අතර, විවිධ පරිත්‍යාගශීලීන්ගෙන් ලැබුණු ලී සහ සිමෙන්ති යොදාගෙන ඔවුන් විසින්ම නව නිවාස ඉදිකරගෙන තිබේ. ඔවුන් මිලදී ගත් ඉඩම් ලබා ගත හැකි ලාභම බිම් කොටස් වන අතර, ඒවා වනාන්තර හා වැව්වලට ආසන්නව පිහිටා තිබුණි. මෙයින් අදහස් වන්නේ නිවාස තැනීමට හා ඒවා ජීවත්වීමට සුදුසු තත්වයට පත්කිරීමට ඔවුන් මහන්සි විය යුතු බවයි.

***" කාලයත් සමඟ නව පරම්පරාවන් උපත ලැබීම නිසා, නෙරපා හැරීමෙන් පසු පුත්තලම් වෙත පැමිණි සෑම පවුලකටම, දැන් තවත් පවුල් දහයක් හෝ වැඩි ගණනක් තිබෙනවා. "***

එහෙත්, මෙම පවුල් වලින් බොහොමයක් තවමත් එක් නිවසක් බෙදා ගනිමින් ජීවත් වෙති. ආපසු පැමිණි පවුල් 2,000 ක් හෝ ඊට වැඩි ගණනක් තනිවම තම ඉදිකිරීම් කටයුතු කරගත් අතර කිහිප දෙනෙකු සඳහා ඉන්දියානු නිවාස ව්‍යාපෘතිය හරහා නිවාස ලැබී තිබුණි.

ඔවුන්ගෙන් බොහෝ දෙනෙකු අධ්‍යාපනය සම්පූර්ණ කර නොගෙන තරුණ කාලයේ දීම විවාහ වූ බව කාන්තාවන් පවසයි. අවතැන් වීමේ අත්දැකීම් හේතුවෙන් ඔවුන්ට තම දරුවන් ඇති දැඩි කිරීමට හා හොඳ අධ්‍යාපනයක් ලබා දීමට මහත් පරිශ්‍රමයක් දැරීමට සිදුවී තිබේ. නගරයේ තම ජීවිතය ස්ථාවර කර ගැනීමට උත්සාහ කළ ද පුත්තලමේ වැසියන් ඔවුන්ගේ වෙනස පෙන්නුම්කළ අතර උතුරේ මුස්ලිම්වරුන් 'සරණාගතයින්'ලෙස හඳුන්වා තිබේ. කෙසේ වෙතත්, නෙරපා හැරීමෙන් පසු පුත්තලමෙ හි උපත ලැබූ තම දරුවන්ට එකම ලේබලය ඇලවිය නොහැකි වීම පිළිබඳව කාන්තාවන් සතුටු වෙයි.

**ඉදිරිය දෙස බැලීම**

ප්‍රජාව මුහුණ දෙන නිරන්තර ගැටලුවක් නම් ප්‍රදේශයේ රැකියා හිඟකම හේතුවෙන් තරුණ තරුණියන්ට රැකියා සොයා ගැනීමට නොහැකි වීමයි. වයස අවුරුදු 16 සහ ඊටත් අඩු ළමයින් මත්ද්‍රව්‍යවලට යොමුවී තිබේ. රැකියාවක් නොමැතිකම එක්තරා ආකාරයකින් මේ සඳහා හේතුවන බවත් - තරුණයින්ට නිශ්චිත ජීවන රටාවක් තිබුණේ නම් ප්‍රජාව තුළ මත්ද්‍රව්‍ය භාවිතය නතර වනු ඇතැයි මව්වරුන් සිතයි.

අධ්‍යාපනයක් නොලැබුණු ඔවුන්ගේ ප්‍රජාවේ පුද්ගලයින් පුත්තලමේ සාප්පු වල වැඩ කිරීම සහ වඩේ කරත්තයක් මෙහෙයවීම වැනි කුඩා රැකියාවන් වල නියැලී සිටියි. කල්පිටියට යන මාර්ගය දෙපස බොහෝ කාන්තාවන් මෝල්වල, ගොවිතැන් කටයුතුවල හා ලුණු ඇසුරුම් කිරීමේ රැකියාවේ යෙදී සිටියි. කෙසේ වෙතත් මේවායින්



ලැබෙන්නේ ඉතා සුළු ආදායමක් පමණි. ඔවුන් රැකියාවක් සඳහා විදේශගත වුවහොත් ඔවුන්ගේ දරුවන් මෙහි තනි වීම සිදුවේ. එබැවින් කාන්තාවන්ට තිරසාර ස්වයං රැකියාවක් සඳහා සහය අවශ්‍ය බව කාන්තාවන්ට හැඟී ගොස් තිබේ. කොල්ලකාරී ක්ෂුද්‍ර මූල්‍ය ණය මගින් ඇති කර තිබෙන තත්වයන්ගේ ප්‍රතිඵලයක් ලෙස කාන්තාවන් කිහිප දෙනෙකුම දැනටමත් සිය දිවි නසාගෙන ඇති අතර, ඔවුන්ගේ කුඩා ආදායමින් ආපසු ගෙවිය නොහැකි පොලී අනුපාත ඒවායේ තිබේ.

**ගෙවල් දෙකක්**

පුත්තලමේ සිටින උතුරේ මුස්ලිම්වරුන් ඇතැම් විට මංගල උත්සව සහ වෙනත් උත්සව සඳහා මන්නාරමේ සිටින ඔවුන්ගේ පවුල් වෙත පැමිණීම සිදුවේ. තම නිවාස කිසිදු උපද්‍රවයකින් තොරව තවමත් පවතින බව ඔවුන්ට මෙම මෙම චාරිකා වලදී දැකිය හැකිය. කෙසේ වෙතත්, උතුරේ පිහිටි සිය නිවෙස්වලට නැවත පැමිණීම යනු තම ජීවිත මුල සිටම නැවතත් ආරම්භ කිරීම බව බොහෝ දෙනා සඳහන් කරයි. එසේම එය පුත්තලමේ ඔවුන්ගේම පවුල් සමඟ සිටින තම දරුවන් නැවතත් අධ්‍යාපනයෙන් උදුරා ගැනීමක් ද වේ. එම තත්වය තුළ තම දරුවන් සමඟ මෙහි නැවතී සිටිනවාද නැත්නම් තනිවම යන්නේ දැයි කාන්තාවන් තමන්ගෙන්ම විමසමින් සිටියි. ඒවා තමන්ගේම අනන්‍යතාවයේ කොටසක් නිසා බොහෝ පවුල් කිසි විටෙකත් උතුරේ ඉඩම් විකුණා නැත.

***"ඔබ මගේ ගෙදර කොහේද කියලා ඇහුවොත්, මට එක තැනක් කියන්න බැහැ. දැන් මන්නාරමත්, පුත්තලමත් දෙකම මගේ ගෙදර."***

පුත්තලමේ දී ඡන්දය ප්‍රකාශ කිරීම සඳහා උතුරේ මුස්ලිම්වරුන් 12,000 ක් ලියාපදිංචි වී තිබේ. තවත් 38,000 ක් දෙනාට තවමත් මන්නාරමේ ඡන්දය තිබෙන නමුත් ඔවුන් සියල්ලන්ම මැතිවරණයක් අතරතුර දී නැවත එහි පැමිණීම සිදු නොවේ.

පුත්තලමේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මගින් මන්නාරමේ මුස්ලිම්වරුන්ට නිල ලිපි හෝ ලියකියවිලි නිකුත් නොකරන බැවින් ඔවුන්ට අවශ්‍ය ලිපි ලේඛන ලබා ගැනීම සඳහා ඔවුන් ආපසු යා යුතුය. එබැවින් පුත්තලමේ උපත ලැබූ පරම්පරාවල තරුණ තරුණියන් ඡන්දය ප්‍රකාශ කිරීම සඳහා එහි ලියාපදිංචි වී නැත.

නෙරපා හැර වසර තිහක් ගතවී ඇතත්, තවමත් පුත්තලමේ වෙසෙන උතුරු මුස්ලිම්වරුන් කෙරෙහි, දේශපාලන නායකයින් ක්‍රියා කරන්නේ ඒ ආකාරයෙන් කිසි විටෙකත් සිදු නොවූ ලෙසටය. යුද්ධයෙන් පසු දශකයකට පසුව පවා නැවත පදිංචි කිරීමේ ක්‍රියාවලියක් ප්‍රජාව වෙනුවෙන් ඉදිරිපත් වී නැත. අවතැන්ව සිටින අය කොපමණ සංඛ්‍යාවක් සිටිනවාද, කීදෙනෙක් ආපසු පැමිණ තිබේද, සහ කිසිවෙකු තවමත් සරණාගත කඳවුරුවල වාසය කරන්නේද යන්න පිළිබඳව මේවන විටත් තොරතුරුවල හිඟයක් තිබේ.

පශ්චාත් යුධ තත්වයන් සහ අරගලයන් පිළිබඳ වැඩ සහ සාකච්ඡා සඳහා සිවිල් සමාජ සංවිධාන කලාතුරකින් පුත්තලම වෙත පැමිණේ. පසුගිය වසර දහය තුළ සිදුවී ඇති සංක්‍රාන්ති යුක්තිය සහ පශ්චාත් යුධ වන්දි ගෙවීම් පිළිබඳ සාකච්ඡාවලදී තමන්ව අමතක වී ඇති බව පුත්තලමේ සිටින උතුරේ මුස්ලිම්වරුන්ට හැඟී තිබේ.



# මීගමුව

අවතැන්වී සිටින විට ඔවුන්ගේ පවුල්වල පළමුවෙන් උපත ලැබූ සහ අලුත් ස්ථානවල පදිංචි වීමෙන් මාස කිහිපයකට පසු උපත ලැබූ, නෙරපා හැරීම අත්දකිනු නොලැබූ තරුණ තරුණියන්ගේ පරම්පරාවක් සිටී. ගෙවී ගිය වසර තිහ තුළ, ඔවුන් ද තමන්ගේම ජීවිත ආරම්භ කර ඇති අතර, ඔවුන්ගේ දෙමව්පියන් තම ගෙදර යැයි නොපවසන තැනක ඔවුන් මුල් බැස ගෙන තිබේ.

***"අපේ පවුල පෝරුතොට හි ජීවත් වූ කාලයේ දී පල්ලිය සහ මෙතන කිලෝමීටර් 1 ක දුරක් ඇතුළත අපි දස වතාවක් ගෙවල් මාරු කරලා තියෙනවා. මෙම ගෙදර, කුලියට හිටපු ගෙවල් වගේ නෙවෙයි, අපේම ව්‍යාපාරයෙන් උපයා ගත්ත මුදල්වලින් අපිම මිලදී ගත් ඉඩමක සහ හදාගත්ත ගෙයක්."***

**ආපසු යාමේ උත්සාහයක්**

යුද්ධය අවසන් වූ විගසම, ඉන් පසු වසරවල දී, තමන් අතහැර දමා පැමිණි ව්‍යාපාර නැවතත් ආරම්භ කිරීම සඳහා ඇතැම් පවුල් යාපනයට ආපසු යනු ලැබීය. වෙළඳපලවල සාප්පු හිමිකරුවන් වූ පිරිමින් සෑම සති කිහිපයකට වරක් යාපනය සහ මීගමුව අතර ගමන් කර ඇති අතර ඒ කාලයේ දී ආපසු පැමිණීමට ද තරමක හැකියාවක් තිබුණි. මීගමුව අවට ජීවිතය සකසාගත් බොහෝ දෙනෙකුට නැවතත් උතුරට යෑමේ අපේක්ෂාවක් නැති අතර ඔවුන් එසේ කරන්නේ නම් ඔවුන් අනිවාර්යයෙන්ම රජයෙන් කිසිදු සහයක් අපේක්ෂා කරන්නේ ද නැත.

මීගමුවේ රැකියාවක් හෝ ව්‍යාපාරයක් ආරම්භ කිරීමට නොහැකි වූ අය නැවතත් උතුරට ගොස් තිබේ. දැන් මීගමුව නගරයේ හෝ පිටකොටුවේ ව්‍යාපාර හිමිකාරීත්වය දරන අනෙක් අය යාපනයේද එම අවස්ථා තිබේදැයි කල්පනා කරති. යාපනයේ පාසල් හින්දු සිසුන් ඇතුළත් කර ගැනීමට වැඩි කැමැත්තක් දක්වන බැවින් තම දරුවන්ට ඇති අධ්‍යාපන අවස්ථාවන් සීමා වනු ඇතැයි ඔවුහු සැක කරති.

**බිඳෙන සුළු ප්‍රජාවක්**

මුළුමනින්ම මුස්ලිම් ප්‍රදේශයක් වන පෝරුතොට ප්‍රජාව සමඟ ඔවුන්ගේ සම්බන්ධතාවය සංකීර්ණ ය. 1990 දී උතුරෙන් පිටවී මීගමුවට පැමිණි අයට හමු වූ ත්‍යාගශීලීභාවය කාන්තාවන් විසින් සිහිපත් කරන ලදි. උතුරේ මුස්ලිම්වරුන්ට මුස්ලිම් පල්ලියේ නවාතැන් ලබාදීමට සහ ආහාර සැපයීමටත්, නිවාස සොයමින් සිටි පවුල්වලට කුලී නිවාස ලබාදීමටත් ප්‍රදේශවාසීන් ඉක්මනින් සූදානම් වී තිබේ.

සියලුම ලියකියවිලි අතහැර දැමීමට සිදු වුවද, පෝරුතොට පාසල් සුපුරුදු ලිපි ලේඛන ඉල්ලීමකින් තොරව උතුරු මුස්ලිම් ප්‍රජාවේ සිසුන් පහසුවෙන් ඇතුළත් කර ගනු ලැබීය. ඉස්ලාමය අන් අයට ත්‍යාගශීලී වීමේ වැදගත්කම දේශනා කරයි, එබැවින් ප්‍රාදේශීය ප්‍රජාව ඉතාම ආගමිකවීමත් සහ ආගමික ඉගැන්වීම් සමීපව අනුගමනය කිරීමත් නිසා ඔවුන්ට උපකාර ලැබුණු බව කාන්තාවන් විශ්වාස කරයි.

***"එදිනෙදා ජීවිතයේදී අපි ජීවත් වන්නේ ප්‍රාදේශීය ප්‍රජාව සමඟයි. අපි බොහෝ දුරට ඔවුන් සමඟ හොඳ සබඳතා පවත්වනවා. කොහොම උනත් අපගේ ජීවිත කාලය පුරාම අපිව 'යාපනය ජනතාව' විදිහට ලේබල් කරලා හඳුන්වනවා."***

ආරවුල් සහ එකඟ නොවීම් වලදී මෙම වෙනස බොහෝ දුරට භාවිතා වේ. පුද්ගලයන් දෙදෙනෙකු අතර ඇති ගැටලුවල දී, එක් අයෙකු උතුරේ මුස්ලිම් ප්‍රජාවට අයත් නම්, බොහෝ විට එය 'යාපනය ජනතාව' සමඟ වන ගැටලුවක් දක්වා පහළ හෙලීම සිදුවේ. ඒ හා සමානව, මෙම වෙනස් කොට සැළකීම මීගමුවේ සිටින සියලුම මුස්ලිම්වරුන් අතර නොපවතින බව උතුරේ මුස්ලිම්වරුන් දන්නා නිසා, ඔවුන්ගේ මුළු ප්‍රජාවම මේ ආකාරයෙන් හැඳින්වීමක් නොවේවායි ඔවුහු ප්‍රාර්ථනා කරති.

ඔවුන් පවසන පරිදි මෙම ආකල්පය ඇති වී ඇත්තේ, අර්ධ වශයෙන් උතුරේ මුස්ලිම්වරුන්ට ඔවුන් මීගමුවේ ජීවත් වූ දශක තුන තුළ අත්කර ගැනීමට හැකි වූ ආර්ථික සාර්ථකත්වයේ ප්‍රතිඵලයක් වශයෙනි. බොහෝ පෝරුතොට

වැසියන් ධීවර කර්මාන්තයේ හෝ වඩු වැඩවල නිරත වී සිටින අය වන අතර ඒවායින් ස්වභාවයෙන්ම ස්ථිර ඉහළ ආදායමක් නොලැබේ. බඩු කිහිපයක් සහිත ෂොපින් බෑග් රැගෙන, මීගමුවට පැමිණි උතුරේ මුස්ලිම්වරුන් සතුව දැන් ඉඩම්, වඩා හොඳ නිවාස සහ පිටකොටුවේ සාප්පු තිබෙන ආකාරය ඔවුන් කලපනා කරයි.

පල්ලියේ භාරකාර මණ්ඩලයේ හෝ පාසල් සංවර්ධන මණ්ඩලයේ තනතුරු කිසි විටෙකත් උතුරේ මුස්ලිම්වරුන්ට ලබා නොදේ. ප්‍රාදේශීය ප්‍රජාව එදිනෙදා ජීවිතයේ හා අන්තර්ක්‍රියාකාරිත්වයේ කිසිදු ගැටලුවක් ඇති නොකරන නමුත් ඔවුන් කිසිදු විටක 'යාපනය ජනතාව'බලය සහිත තනතුරකට පත්කර ගන්නේ නැත.

### අනියත අනාගතයන්

පසුගිය දශකය තුළ මුස්ලිම් ප්‍රජාව දෙසට යොමු වූ වර්ගවාදයේ ඉහළ යෑමක් ඔවුන් විසින් නිරීක්ෂණය කර තිබේ. පාස්කු ඉරිදා ප්‍රහාරයෙන් පසු මෙ තත්වය ඉහළ නැගුණි. කෙසේ වෙතත්, බෝම්බකරුවන් යාපනයේ සිට හෝ උතුරේ කොතැනක හෝ සිටියා නම්, ඔවුන්ට - ප්‍රාදේශීය ප්‍රජාව තුළින් - අමතර පීඩනයක් එල්ල වනු ඇතැයි ඔවුහු සිතති.



ශ්‍රී ලංකාවේ COVID-19 හේතුවෙන් ඇති වූ පළමු මරණය වශයෙන් වාර්තා වූයේ පෝරුතොට ජීවත් වූ උතුරේ මුස්ලිම් ජාතිකයෙකුගේ මරණයකි. ඔහුට වෛරසය ආසාදනය වී ඇති බවට කිසිදු වෛද්‍ය වාර්තාවක් නොතිබුණද, ඔහු සමඟ දීර්ඝ කාලයක් ගත කිරීමෙන් පසුවද ඔහුගේ පවුලේ කිසිවෙකුට එය ආසාදනය වූ බවක් පරීක්ෂණවලින් පෙන්වා නැත. පවුලේ කැමැත්තට සහ ආගමික විශ්වාසයන්ට එරෙහිව ඔවුන්ගේ අනුදැනුමකින් තොරව ඔහුගේ දේහය ආදාහනය (ආරක්ෂිත හා ගැඹුරු භූමදානය සඳහා විකල්පයක් ලබා දී ඇති සෞඛ්‍ය අමාත්‍යාංශ චක්‍රලේඛයක් තිබියදී) කරන ලදි. සිද්ධියෙන් පසු දින කිහිපය තුළ, නිවසට ආහාර ලබා දීම වැනි ආකාර වලින් පවුලට ප්‍රාදේශීය සහයෝගය විශාල වශයෙන්, ලැබුණු අතර, බොහෝ දෙනෙක් සිදු වූ වැරැද්දට වගවීම ඉල්ලා පෙළ ගැසී සිටින ලදි. එතැන් සිට මාස කිහිපය තුළ, මියගිය අයගේ පවුල නිරෝධායනය වෙමින් සිටිය දී මෙම සහයෝගය අඩු වී තිබේ. මෙම කාරණය උසාවියට ගෙන ගියහොත් මීගමුවේ මුස්ලිම් ප්‍රජාව ඔවුන් සමඟ සිටිනු ඇත්දැයි පවුලේ අය සැක පහළ කරති.

මෙම ආකල්ප හා දිවයිනේ බහුතර ප්‍රජාව සුළුතර ප්‍රජාවන් කෙරෙහි දක්වන ආකල්ප අතර සමානකම් දක්නට ලැබෙන බව ඇතැම් උතුරේ මුස්ලිම්වරුන් කරයි. මුස්ලිම්වරුන්ට ශ්‍රී ලංකාවට කිසිදු අයිතියක් නැති බවට සිංහල ජාතිකවාදීන් ප්‍රකාශ කරන ආකාරයටම, දශක තුනක් තිස්සේ තමන් ජීවත් වූ ස්ථානයකට උතුරේ මුස්ලිම්වරුන්ට හිමිකමක් නැතැයි මීගමුවේ මුස්ලිම්වරු ප්‍රකාශ කරති.

පෝරුතොට මුස්ලිම් පවුල් දෙකක් අතර ඇති වූ මතභේදයකට උතුරේ මුස්ලිම්වරයකු වක්‍රව සම්බන්ධ වූ සිද්ධියක් මෑතකදී සිදුවිය. ආතතීන් උත්සන්න වූ අතර, කිසිදු වරදක් නොතිබුණද, මුස්ලිම් පල්ලියේ භාරකරුවන් විසින් යවන ලද ලිපියක් මගින් උතුරේ මුස්ලිම් පවුලට ගමෙන් ඉවත් වන ලෙස දැනුම් දෙන ලදි. තමන්ට ද පිටව යන ලෙස නියෝග කළ හැකි දවසක් පැමිණෙනු ඇති බව මේ සිදුවීමෙන් පසුව උතුරේ මුස්ලිම් පවුල් බොහොමයක් කල්පනා කරමින් සිටිති.

COVID මරණය යැයි කියන සිද්ධියේදී, ඒ පුද්ගලයාට ඇත්ත වශයෙන්ම වෛරසය නොමැති බවත්, එසේ ප්‍රකාශ කිරීම සඳහා විවිධ මට්ටමේ මැදිහත්වීම් තිබූ බවත් මුළු ප්‍රජාවම දැන සිටියෝය. COVID ආසාදනය සැබවින්ම තහවුරු වූයේ නම්, ඔවුන්ට තවදුරටත් එම ප්‍රදේශයේ ජීවත් වීමට හැකි වේ දැයි විශ්වාසයක් එම පවුලට නැත.

***"අපට මෙහි සාමකාමීව ජීවත් විය හැක්කේ කවදාදැයි අපට විශ්වාසයක් නැහැ. කෙසේ වෙතත්, වැඩි පිරිසක් මීගමුවේ උපත ලබා තියෙනවා වගේම බොහෝ දෙනෙක් ප්‍රාදේශීය මුස්ලිම් ප්‍රජාව සමඟ විවාහ වී තිබෙනවා. සැම නව පරම්පරාවක් සමඟම සබඳතා වැඩිදියුණු වේවි කියලා අපි බලාපොරොත්තු වෙනවා. "***